# හිජාබ්

## එහි අවශ්‍යතාව කුමක්ද?

පරිවර්තනය:

එස්.එම්.මන්සූර්

SINHALI - 253

Co-operative office for Call & foreigners Guidance at Sultanah

The Co-operative office for Call & foreigners Guidance at Sultanah
Under the supervision of Ministry of Islamic Affairs and Endowment and Call and Guidance
Tel. 4240077 Fax 4251005 P.O. Box 92675 Riyadh 11663 E-mail: Sultanah22@hotmail.com

# හිජාබ්

## එහි අවශ්‍යතාවය කුමක්ද?

මහාචාර්ය සෙයික් මුහම්මද් බින් ඉස්මායිල්

ඉංග්‍රීසි පරිවර්තනය හා අර්ථ විවරණය
ආචාර්ය සාලිහ් අස් සාලිහ්

සිංහල පරිවර්තනය
එස්. එම්. මන්සූර්

# පටුන


පෙරවදන ........ 01

ඉංග්‍රීසි පරිවර්තකයාගේ පෙරවදන ........ 06

හැඳින්වීම ........ 09

හිජාබයේ වැදගත්කම ........ 11

1. සීකරුහාවයෙන් යුත් ක්‍රියාවක් ........ 11
2. හිජාබ් යනු 'ඉෆ්ෆාහ්' (විනීතභාවය) වේ! ........ 14
3. හිජාබ් යනු 'තහාරා' (පවිත්‍රතාවය) වේ! ........ 15
4. හිජාබ් ආරක්ෂාව සඳහා වූ පලිහක් වේ! ........ 16
5. හිජාබ් යනු තක්වාහ් (දෙවියන් කෙරෙහි බිය හා ආදරය) වේ! ........ 17
6. හිජාබ් යනු 'ඊමාන්' (විශ්වාසය) වේ! ........ 18
7. හිජාබ් යනු 'හයා' (ලජ්ජාව) වේ! ........ 19
8. හිජාබ් යනු 'ඝීරාහ්' (සිත් කහස්සල්ල) වේ! ........ 20

තබර්රුජ් ය (කාන්තාවන්ගේ වශීකරණය පෙන්වීම) නින්දවකි! ........ 22

1. තබර්රුජ් යනු අල්ලාහ්ට සහ ඔහුගේ වක්තෘට අකීකරුවීම වේ! ........ 22
2. තබර්රුජ් යනු භයානක, විනාශකාරී පාපයක් වේ! ........ 23
3. තබර්රුජ් ය අල්ලාහ්ගේ ශාපයට ලක්වීම සහ ඔහුගේ කාරුණිකභාවයෙන් ඈත්වීම ගෙන දෙයි! ........ 24
4. තබර්රුජ් ය නරකාදියේ සිටිනාවුන්ගේ ගතිගුණ හා සමානය! ........ 24
5. තබර්රුජ් ය මරණින් පසු ජීවිතයෙ හි අන්ධකාරය ගෙන දෙයි! ........ 25

6. තබර්රුජ ය 'නිෆාක් (කපටිකම) වේ! ........................ 26

7. තබර්රුජ ය නීච, අවනම්බුකාර ක්‍රියාවකි! ................ 26

8. තබර්රුජ ය නොයෙක් පාපයන්ට මඟ පෙන්වන මහා පාපයකි! ................................................ 27

9. තබර්රුජ ය ෂෙයිතාන්ගේ මාර්ගය යි! ........................ 28

10. තබර්රුජ ය යුදෙව්වන් ගේ මාර්ගය යි! .................. 30

11. තබර්රුජ ය අපවිත්‍ර ජාහිලියියාවක් (නුගත් කමක්) වේ! ................................................ 33

12. තබර්රුජ ය නිරිසන්කමකි: බාධක හා පිරිහීම ගෙන දෙන්නකි! ................................................ 34

13. තබර්රුජ ය පාපයන්ගේ දෙරටුව වේ! ........................ 35

හිජාබ් අදින්නන් සැලකිය යුතු අවශ්‍ය අනිවාර්‍ය කරුණු! .. 39

1. ශරීරය සම්පූර්ණයෙන් වැසීම! ................................ 39

2. හිජාබ ය ප්‍රදර්ශනයක් නොවිය යුතුයි! ...................... 39

3. හිජාබ ය විනිවිද පෙනෙන එකක් නොව, ඝනකම් එකක් විය යුතුයි! ................................................ 40

4. හිජාබ ය ශරීරයට තද එකක් නොවී ඉඩපාඩු ඇති එකක් විය යුතුයි! ................................................ 41

5. හිජාබයේ සුවඳ විළවුන් ආලේප නොකළ යුතුයි! ........ 42

6. හිජාබ ය පිරිමින්ගේ ඇඳුම් මෙන් නොතිබිය යුතුයි! .. 42

7. හිජාබ ය කාෆිර් (මුස්ලිම් නොවන) කාන්තාවන්ගේ ඇඳුම්වලට සමාන නොවිය යුතුයි! ........................ 43

8. හිජාබ ය ප්‍රසිද්ධිය තකා අඳින්නක් නොවේ! .............. 44

9. විදහා පෙන්වීමේ සැඟවුණු ක්‍රමයන්! ........................ 45

සවන් දෙමු ; සාදරයෙන් පිය නඟමු! ........................ 49

# පෙරවදන

'සදාචාරය දිවිහිමියෙන් රැකිය යුත්තකි' යන්න, මිනිස් සමාජයේ දීර්ඝ කාලයක් පැවත එන අදහසකි. ලොව ජීවත් වූ, ජීවත් වන කවුරුන් හෝ වේවා, මෙම අදහසට වෙනස් වූ තවත් අදහසක් දැරූ බවට හෝ දරණ බවට හෝ සාක්ෂියක් නැත.

සෑම ආගමක්ම විෂමාචාර වූ ගැහැණු – පිරිමි සම්බන්ධතාවය හා එයින් ඇතිවන භයානක තත්ත්වය හෙළා දකියි; පිවිතුරු සදාචාරාත්මක ජීවිතය උතුම් කොට සලකයි; එයට ආශිර්වාද කරයි. නමුත්, එම සදාචාරාත්මක ජීවිතය කෙසේ ගෙන එන්නේ ද; පවින් පිරුණු විෂමාචාරය මුලින් උදුරා දමන්නේ කෙසේ ද යනු ගැන.ඉස්ලාමය හැර සෙසු ආගම් ප්‍රායෝගික මගක් ගෙන දක්වා ක්‍රියාත්මක කළේ නැත.

ස්ත්‍රීන් හා පුරුෂයන් අතර කිසිම කඩතුරාවක් හෝ ආවරණයක් නොමැතිව, උරෙන් උර ගැටී සෙල්ලම් කිරීමටත්, සෑම කටයුත්තක්ම කිරීමටත් හැකි පරිසරයක් ඇතිකර දීමෙන් පසුව, සදාචාරයේ මහිමය ගැන කතා කිරීමෙන් කිසිම ඵලක් නැත. අද, නොයෙකුත් සමාජයන් හි ස්ත්‍රී පුරුෂ සම්බන්ධතාවයන් වැරදි මාර්ගයන්හි හැඩගැසීම, විෂමාචාරය ව්‍යාප්ත වීමට ප්‍රධාන කාරණයක් වී ඇත.

මෙම භයානක තත්ත්වය මුස්ලිම් සමාජය තුළත් ඇතිවීමේ ලකුණු දැන් සමහර තැන්හි පෙනෙන්නට ඇත. මෙයට කාරණය නම්, මුස්ලිම්වරුන්ගෙන් වැඩිදෙනෙක් ඉස්ලාමයෙන් තොරව තම ජීවිතය පවත්වාගෙන යෑමට පටන් ගැනීමය. මෙම අනුවේදනීය තත්ත්වය ඇතිකිරීමෙහිලා ඉස්ලාමයට විරුද්ධ බටහිර, ලෞකික චින්තනයන් හා එම චින්තන අනුව බටහිර පන්නයට ආවඩන ලේබල් මුස්ලිම්වරුන් ක්‍රියා කරගෙන යයි. මෙය වනාහි මුළු මානව සංහතිය ම තිරිසන් යුගයක් කරා ගෙනයන නින්දිත ක්‍රියාවකි.

ඉස්ලාමය වනාහි මානව සංහතිය තුළ සදාචාරාත්මක සමාජ ක්‍රමයක් ඇතිකිරීමෙහිලා ස්ථිර චේතනාවක් හා වැඩපිළිවෙළක් ගෙන ඇති දිවිපෙවෙතකි. මේ නම් අකුරට පමණක් සීමාවූවක් නොවේ. මුළු ලොවටම ආදර්ශමත් විශිෂ්ට සමාජයක් ඇතිකිරීමට මේවා තුළින් ඉස්ලාමය සමත් වී ඇත.

මෙම චේතනාව හා ක්‍රියා පිළිවෙළ පියවර සතරකින් සමන්විත ය.

**පළවෙනි පියවර** : විෂමාචාර ලෙස ස්ත්‍රීන් හා පුරුෂයින් අතර ඇතිවෙන සම්බන්ධතාවයන් ලොවෙහි ඇතිකරන පාපකාරී තත්ත්වය කුමක් ද; සමාජ පරිහානිය කුමක් ද; ගෙන එන ලෙඩ රෝග මොනවා ද ; එයින් ඇතිවන අපකීර්තියන් හා අගෞරවයන් මොනවා ද යනු ඉස්ලාමය විස්තර කරයි. එමෙන්ම, මෙම පාපකාරී ක්‍රියාවන් නිසා මරණින් මතු ජීවිතයේ අල්ලාහ් අභියස හා අනෙකුත් තැන්හි ලැබෙන දඬුවම් හා දුක්ඛිත තත්ත්වයන් මොනවා ද යන්න ද ගෙන දක්වයි. මෙලෙස, දුරාචාරය කෙතරම් පාපකාරී ක්‍රියාවක් ද යන්න අප හද තුළ ඇති කරයි.

**දෙවනුව** : ලේ ඥාතීන් නොවන අන්‍ය ස්ත්‍රීන් හා පුරුෂයන් අතර කඩතුරාවක් නොමැතිව, නිදහස් ආශ්‍රයක් ඇතිකර ගැනීමේ පරිසරය, විෂමාචාර ක්‍රියාවන්ට තුඩුදෙන බව කවුරුත් දන්නා කරුණකි. එනිසා, එම පරිසරය වෙනස් කිරීමට ඉස්ලාමය මග පාදයි. සෑම කෙනෙකුගේම බැල්ම, කතාව හා ක්‍රියාවන් කෙසේ විය යුතුද; ඇඳුම් පැළඳුම් කෙසේ තිබිය යුතුද; කිට්ටු ඥාතීන් (උදහරණයක් වශයෙන්: පියා – දුව, මව – පුතා, සහෝදර – සහෝදරියන්) අතර පවා යමක් කමක් තේරෙන වයසට ආ විට කෙසේ හැසිරිය යුතු ද වැනි දේ විස්තර කර.ඒවා ක්‍රියාත්මක කොට පෙන්නුවේය.

**තෙවනුව** : ඉහත සඳහන් පරිදි ස්ත්‍රී හා පුරුෂ දෙපාර්ශ්වයම වෙන්කොට තැබුවත්, ඔවුන්ගේ සිත හා කය වැඩෙන විට ඒ සමගම යම් යම් හැඟීම් හා එකිනෙකා කෙරෙහි කිසියම් ආදරයක්, ආශාවක් ද වැඩෙයි; මෙයින් ශාරීරික අවශ්‍යතාවයන් ද ඔවුනට ඇතිවෙයි. මෙය ඉස්ලාමය විසින් තහනම්කොට නැත. නමුත්, මෙය වැරදි මාර්ගයකින් ඉටුකර ගැනීමට ඉස්ලාමය ඉඩ නොදෙයි. මේ සඳහා ඉස්ලාමය ඇතිකර ඇති ක්‍රියා මාර්ගය නම්, අල්ලාහ් පවසා ඇති පරිදි නීත්‍යානුකූලව ස්ත්‍රිය හා පුරුෂයා විවාහ විය යුතු බවය. මෙම විවාහය පහසුවෙන් කර ගැනීමට ඉස්ලාම් අවශ්‍ය විධි විධාන යොදා ඇත.

**සිව්වෙනුව** : ඉහත සඳහන් සෑම ක්‍රියා මාර්ගයක් ම අභිබවා යම් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් වැරදි කළහොත්, ඔවුන් විභාග කර,කළ වරදට දඬුවම් දීම සඳහා නීති පද්ධතියක් ද ඉස්ලාමය විසින් සකසා ඇත. උස් කඳුවැටි හා ගැඹුරු පල්ලම් අතර ඇති මාවත්හි වේගයෙන් යන වාහනයන්ගේ ආරක්ෂාව තකා සමහර තැන්හි

මාර්ග සංඥා දක්නට ඇත. එමෙන්ම, සවිමත් තාප්ප ද දක්නට ඇත. මෙයින් පෙනීයන්නේ එම සංඥාවන් නොතකා වේගයෙන් යන්නන් බේරාගැනීමට මෙම තාප්ප තනා ඇති බව ය. මෙවැන්නක් ය ඉස්ලාමයේ නීති පද්ධතියත්. මේ වනාහි සදාචාරයේ පැවැත්ම සඳහා ඉස්ලාමය ක්‍රියාත්මක කරන ඉහත සඳහන් ක්‍රියා මාර්ගය නොතකා වැරදි කරන්නන් යහ මඟට ගෙන ඒමට හා එවැන්නන්ගෙන් මානව සංහතිය ආරක්ෂා කර ගැනීමට ගනු ලබන පියවරකි.

මෙලෙස, සදාචාරාත්මක සමාජයක් නගා සිටුවීමෙහි ලා ඉතා ශ්‍රේෂ්ඨමත් ප්‍රායෝගික වැඩපිළිවෙළක් අනුව කටයුතු කළ ඉස්ලාමය වැනි තවත් ආගමක් හෝ ජීවන සැලැස්මක් ලබා ගැනීම කිසිසේත් නොහැක.

ඉස්ලාමය එතරම් ශ්‍රේෂ්ඨ ජීවන සැලැස්මක් ය. මිනිස් ජීවිතයේ සෑම අංශයක් ම, සෑම දෙයක්ම සොබා දහමට එකඟව කරගෙන යෑම සඳහා පහසු වැඩ පිළිවෙළක් එහි ඇත. එපමණක් නොව, ඉස්ලාමයේ මෙම වැඩ පිළිවෙළ අනුව සමාජයක් ද ඇතිකරනු ලැබ ඇත. අද මුස්ලිම්වරු නොයෙකුත් ප්‍රශ්නයන්ට මුහුණ පා සිටිති. මෙවන් අවධියක ද අනෙක් සමාජයීය මිනිසුන්ට වඩා මුස්ලිම්වරුන් අතර සංවරභාවයෙන් යුත් උසස් ගුණාංග ඇත්තේ නම්, එයට සම්පූර්ණ හේතුව වන්නේ ඉස්ලාමයේ මඟ පෙන්වීම ය.

ඉස්ලාමයේ මෙම කරුණු සම්බන්ධව, අප සැවොම මොහොතක් සිතා බැලීම අවශ්‍යය. අද, මානව සංහතියෙහි සදාචාරය ගෙන ඒමට මෙය හැර වෙනත් මඟක් නොමැත.

ඔබ අත ඇති මෙම කුඩා පොත, සදාචාරය නගා සිටුවීමට ස්ත්‍රීන් කෙසේ හැසිරිය යුතු ද; ඔවුන්ගේ ඇඳුම් පැළඳුම් කෙසේ තිබිය යුතු ද; ඒ සඳහා වූ නීතිරීතීන් මොනවා ද යනු විස්තර කරයි. මහාචාර්ය සෙයික් මුහම්මද් බින් ඉස්මායිල් තුමා විසින් රචිත, 'හිජාබය වෙත හැරීම – තෙවැනි කොටස' නම් වූ මෙම පොතේ සාරාංශය පරිවර්තනය කර, අවශ්‍ය සාක්ෂි හා විස්තරයන් ආචාර්ය සාලිහ් අස් සාලිහ් විසින් අධෝලිපි තුළින් ගෙන දක්වා ඇත. මෙම පොත ශ්‍රී ලාංකික සහෝදරයෙකු වූ එස්. එම්. මන්සූර් මහතා සරල ව සිංහලයට පරිවර්තනය කර දුන්නේ ය. එමෙන් ම, මෙම පොත ඔබ අතට පත් කිරීමට නන් අයුරින් එම්. යූ. එම්. රහ්බි මහතා සහාය වූයේය. මෙම ශ්‍රේෂ්ඨ ඉස්ලාමීය සහෝදරයින්ට අපගේ ස්තුති ප්‍රණාමය පුද කරමු.

මෙම පොත කියවන සෑම කාන්තාවක් ම මෙහි ඇති කරුණු සිතට ගෙන තම ජීවිතයේ පිළිපැදිය යුතුයි; අනෙක් කාන්තාවන්ටත් මේ ගැන කිවයුතුයි. මේවා පිළිගෙන පිළිපැදීමට විනාඩියක්වත් කල් නොදැමිය යුතුයි.

මෙම පොතෙහි අවසාන පිටුවක, හිජාබය ගැන වූ කුර්ආන් වාක්‍යයක් අනාවරණය වූ විට අන්සාරි කාන්තාවන් එයට අවනත වූයේ කෙසේ ද යනු ආයිෂා (රලි) තුමිය කියන්නීය. එම කාන්තාවන්ගේ ආදර්ශය ගෙන ජීවත් වීම අපගේ යහපතට කරුණක් වෙයි.

කරුණාන්විත අල්ලාහ්, අප ජීවිතය දෙලොවෙහි ම සාර්ථක කර ගැනීමට හා ජය ලබා ගැනීමට ඉස්ලාමය දී ඇත. එය අනුව ජීවත් වීමට වැරදුනු තැන ඇතිවන විපාකයන්ට අපම වැරදිකරුවෝ වෙමු; අල්ලාහ් වැරදිකාරයා නොවෙයි.

අල්ලාහ් පවිත්‍රතාවයෙන් යුක්තෙකි; ඔහු කිසිවිටෙක වැරදි නොකරයි. ඔහුගේ මඟ පෙන්වීම හා ඔහුගේ වක්තෘ වූ මුහම්මද්(සල්) තුමාගේ ආදර්ශය නොමැතිව කිසිවෙකුටත් කිසි දිනක විමුක්තිය නො ලැබෙයි.

: ප්‍රකාශකයෝ

රියාද්, සවුදි අරාබියාව.
1994 –09 –10

﴿وَمَا كَانَ لِمُؤْمِنٍ وَلَا مُؤْمِنَةٍ إِذَا قَضَى ٱللَّهُ وَرَسُولُهُۥٓ أَمْرًا أَن يَكُونَ لَهُمُ ٱلْخِيَرَةُ مِنْ أَمْرِهِمْ ۗ وَمَن يَعْصِ ٱللَّهَ وَرَسُولَهُۥ فَقَدْ ضَلَّ ضَلَـٰلًا مُّبِينًا﴾

[الأحزاب، الآية ٣٦]

"අල්ලාහ් සහ
ඔහුගේ වක්තෘවරයා
කිසියම් කාර්‍යයක් සඳහා
තීන්දුවක් දුන්නේ ද,
පසුව
එම කාර්‍යය සම්බන්ධයෙන්
තමන්ට විකල්ප තීන්දුවක් ගැනීමේ අයිතියක්
දේව විශ්වාසය ඇත්තාවූ
කිසිදු පුරුෂයෙකුට හෝ
කිසිදු ස්ත්‍රියකට හෝ
නොමැත.
තවද,
අල්ලාහ්ට හා
ඔහුගේ වක්තෘවරයාට
කවරෙකු අකීකරු වන්නේ ද
ඔහු
පැහැදිලිව ම
දුර්මාර්ගයෙහි සිටියි!,

■ අල් කුර්ආන් 33 : 36

# ඉංග්‍රීසි පරිවර්තකයාගේ පෙරවදන

بسم الله الرحمن الرحيم

إِنَّ الحَمْدَ لِلَّهِ تَعَالى نَحْمَدُهُ، وَنَسْتَعِيْنُ بِهِ وَنَسْتَغْفِرُهُ ، وَنَعُوذُ بِاللَّهِ تعالى مِنْ شرورِ أَنفُسِنَا وسيِّئَاتِ أَعْمَالِنَا من يَّهْدِهِ اللَّهُ تعالى فلا مُضِلَّ له : ومن يُضْلِلْ فَلَا هادِيَ لَهُ وأَشهدُ أَن لا إِلهَ إِلَّا اللَّهُ وَحْدَهُ لَا شريكَ له. وَأَشْهَدُ أَنَّ محمَداً عبدُهُ ورَسولُهُ، صلى اللّه عليهِ وآلِهِ وسَلَّمَ.

මහා කාරුණික අති දයාන්විත අල්ලාහ්ගේ නාමයෙන් ආරම්භ කරමි.

අල්ලාහ්ට පමණය, සියලුම පැසසුම් හිමිවන්නේ. ඔහු ප්‍රශංසා කර, ඔහුගේ සහාය පතන අතර අපගේ පව් කෙරෙහි වූ ඔහුගේ සමාව ද ආයාචනා කර සිටිමු. ශ්‍රේෂ්ඨමත් අල්ලාහ් වෙත පව් හා නින්දිත ක්‍රියාවන් හි වැටීම නිමිත්තෙ ආරක්ෂාව පතා සිටිමු. අල්ලාහ්ගේ මඟ පෙන්වීම කාහට ලැබෙන්නේ ද, එම තැනැත්තා වැරදි මාර්ගයක ගෙන යෑම කිසිවෙකුට කළ හැකි නොවේ. එමෙන් ම, අල්ලාහ් ගේ මඟ පෙන්වීම කාහට නොලැබෙන්නේ ද, එම තැනැත්තා යහමඟක ගෙනයෑමද කිසිවෙකුට කළ හැකි නොවේ. තවද, නැමදීමට හා අවනත වීමට ඇත්තේ අල්ලාහ් නම් වූ එකම දෙවියෙකු බව මම සාක්ෂි දරමි; මුහම්මද් (සල්) තුමා අල්ලාහ්ගේ දසවරයා හා වක්තෘවරයා බව ද මම සාක්ෂි දරමි. අවසාන වක්තෘවරයා වූ නබි (සල්) තුමාටත්, එතුමාගේ උතුම් වූ පවුලේ සාමාජිකයින්ටත්, හිත මිතුරන්ටත්, අනුගාමිකයින්ටත් අල්ලාහ්ගේ ශාන්තිය හා සමාදනය ලැබේවා!

﴿ يَٰٓأَيُّهَا ٱلَّذِينَ ءَامَنُواْ ٱتَّقُواْ ٱللَّهَ حَقَّ تُقَاتِهِۦ وَلَا تَمُوتُنَّ إِلَّا وَأَنتُم مُّسۡلِمُونَ ﴾ [آل عمران الآية ١٠٢].

**"ඊමාන්ධාරීනි!* ඔබ අල්ලාහ්ට (අවනත වී, ඔහු අනුමත කළ දේ කිරීමෙනුත්, තහනම් කළ දෙයින් වැළකී සිටීමෙනුත්) බියවිය යුතු ආකාරයට බිය වන්න. තවද, ඔබ මුස්ලිම්වරුන් විලසින් ම මිස මිය නොයන්න."**

**(අල් කුර්ආන් 3 : 102)**

﴿يَٰٓأَيُّهَا ٱلنَّاسُ ٱتَّقُواْ رَبَّكُمُ ٱلَّذِى خَلَقَكُم مِّن نَّفْسٍ وَٰحِدَةٍ وَخَلَقَ مِنْهَا زَوْجَهَا وَبَثَّ مِنْهُمَا رِجَالًا كَثِيرًا وَنِسَآءً ۚ وَٱتَّقُواْ ٱللَّهَ ٱلَّذِى تَسَآءَلُونَ بِهِۦ وَٱلْأَرْحَامَ ۚ إِنَّ ٱللَّهَ كَانَ عَلَيْكُمْ رَقِيبًا﴾ [النساء الآية ١]

**"මිනිසුනි ! ඔබ සියල්ල එක් ප්‍රාණයකින් මැවුවා වූ ඔබගේ ස්වාමියාට ඔබ සැම බිය වන්න. තවද, එම ප්‍රාණය තුළින් ම ඔහුගේ සහකාරිය ඔහු මැවුවේ ය. ඉනික්බිති ව, එම ප්‍රාණ දෙක මගින් (ලොවෙ හි) අපමණ පුරුෂයන් ද, ස්ත්‍රීන් ද පැතිර හැරියේය. එහෙයින් ඔහුට පමණක් බියවන්න. ඔහු තුළින්මය ඔබ එකිනෙකා (තමන්ගේ උරුමයන්) ඉල්ලා සිටින්නේ. තව ද, (ඔබගේ) ලේ ඥාතීන්ට දයාන්විත වන්න. නියත වශයෙන් ම අල්ලාහ් ඔබ නිරීක්ෂණය කරමින් සිටී."**

**(අල් කුර්ආන් 4 : 01)**

﴿يَٰٓأَيُّهَا ٱلَّذِينَ ءَامَنُواْ ٱتَّقُواْ ٱللَّهَ وَقُولُواْ قَوْلًا سَدِيدًا (٧٠) يُصْلِحْ لَكُمْ أَعْمَٰلَكُمْ وَيَغْفِرْ لَكُمْ ذُنُوبَكُمْ ۗ وَمَن يُطِعِ ٱللَّهَ وَرَسُولَهُۥ فَقَدْ فَازَ فَوْزًا عَظِيمًا﴾ [الأحزاب، الآية ٧٠، ٧١]

**"විශ්වාසධාරීනි ! අල්ලාහ් ට බිය වන්න. තව ද, අවංක වචනයෙන් (පමණක්) පවසන්න. අල්ලාහ් ඔබගේ ක්‍රියාවන් යහපත් කරයි; තව ද, ඔබගේ පාපයන්ට සමාව දෙයි, කවරෙකු අල්ලාහ් ට සහ ඔහුගේ වක්තෘවරයාට අවනත වන්නේ ද, හෙතෙම විශිෂ්ට ජයක් අත්පත් කරගනී."**

**(අල් කුර්ආන් 33 : 70,71)**

أما بعد .. فإنَّ أصدق الحديثِ كتابُ اللّهِ تعالى، وخَيرَ الهدي هدْيُ محمدِ صلى الله عليه وآله وصَحْبِهِ وسلَّمَ، وشرَّ الأمورِ محدثاتُها، وكُلَّ مُحْدَثَةٍ بِدعةٍ، وكُلَّ بدعةٍ ضلالةٌ، وكُلَّ ضلالَةٍ في النارِ..

**ඉක්බිති ව, දැනගන්න ....................**

*"වාක්‍යයන් අතරින් වඩා හොඳ වාක්‍යය දේව වාක්‍යය (කුර්ආනය) වෙයි. මග පෙන්වීම් අතරින් වඩාත් නිවැරදිම මග පෙන්වීම මුහම්මද් (සල්) තුමාගේ*

මහ පෙන්වීම වෙයි. දීන් (ඉස්ලාම්) හි ඉතාමත් නින්දිත කාර්‍යයන් වන්නේ (ඉස්ලාමයේ සත්‍ය ඉගැන්වීම්වලට පටහැනි ව) අළුතින් ඇති කරනු ලබන කාර්‍යයන් (බිද් අත්) ය. එක් එක් අළුත් කාර්‍යයක් ම නොමඟ යවන්නකි. නොමඟ යවන සියල්ලක් ම නිරයේ ගින්න දක්වා ඇදයන සුළු ය."

(මුස්ලිම්)

ඔබගේ අත්හි ඇති මෙම පොත, හිජාබයේ අවශ්‍යතාවය මුස්ලිම් ස්ත්‍රී පුරුෂයන්ට අවබෝධ කරදීමේ අදහසින් රචිත වූවකි.

බොහෝ සේ ස්ත්‍රී හු මේ ගැන විමසයි. එහෙයින්, ආචාර්‍ය ෂෙයික් මුහම්මද් බින් ඉස්මායිල් තුමා අතින් ලියැවුනු 'හිජාබ් වෙත හැරීම – තෙවැනි කොටස' නම් වූ පොතෙහි සවිස්තර ව ගෙන දක්වා ඇති කරුණු ලුහුඬින් පරිවර්තනය කර ඔබ අතට පත්කර ඇත්තෙමි.

මම ඇමරිකාවෙ හි සිටිය දී, අනේක සහෝදරයින්ගේ අනුබල දීම නිසා, මෙම කෘතිය තෘප්තිමත් ව නිම කර ගැනීමට උදව් කළ අල්ලාහ් ටය සියලු ප්‍රශංසා හිමිවන්නේ. මෙය හොඳකාර ව සකස් කර ගැනීමට දිරිදුන් ෂෙයික් මුහම්මද් බින් ඉස්මායිල් තුමා හට මගේ අවංක කෘතඥතාවය හිමි වෙයි. මෙම කාර්‍යයෙහි සෘජුව හෝ වක්‍රාකාරව හෝ උදව් උපකාර කළ සැම කෙනෙකුගේම උත්සාහය පිළිගෙන ඔවුන්ට තමාගේ ආශිර්වාදයන් හා අනුග්‍රහයන් පිරිනමන මෙන් අල්ලාහ් වෙත – ඔහුගේ උතුම් නාමයන් හා ගුණාංගයන් මෙනෙහි කර ආයාචනා කර සිටිමි.

අල්ලාහ්ගේ කරුණාව අයැද සිටින,
ආචාර්‍ය සාලිහ් අස් සාලිහ්

හිජ්රි 1413 – 11 – 26.
ක්‍රි. පූ.1993 – 05 – 17.

* රිමාන්ඩාරීන් යන්නෝ කවරහු ද යන්න අවසාන පිටුවේ විස්තර කොට ඇත. මෙම පොතෙහි 'රිමාන්ඩාරීන්' නම් වූ වචනය එන සැම තැනකදීම එම විස්තරය සිතේ තබාගෙන කියවන්න.

මහා කාරුණික අති දයාන්විත අල්ලාහ්ගේ නාමයෙන් ..........

# හැඳින්වීම

*අල්ලාහ් මෙම විශ්වයේ පාලකයා ද, විනිශ්චය දිනයේ අධිපතියා ද වෙයි. දයාව හා කරුණාවෙන් යුත් ඔහුටමය පැසසුම් සියල්ල හිමිවන්නේ. යහපත් ගති පැවතුම් ඇත්තන්ගේ අවසානය සාර්ථක වන්නේ ය. කවර අය නින්දිත ක්‍රියාවන් හි නියුක්ත ව සිටින්නේ ද ඔවුන් හැර, අන් අය අතර වෛරය ඇති නොවේවා!*

*යා අල්ලාහ්! ඔබගේ සලාතය[1], සලාමය (සමාදානය) හා ආශිර්වාදය ඔබගේ වහලා සහ වක්තෘවරයා වූ මුහම්මද් (සල්) තුමාටත්, එතුමාගේ මිතුරන්ටත් අනුගාමිකයින්ටත් හිමි වේවා!*

*මුස්ලිම් කාන්තාවන්ට අදාළ කාර්යයන් හි ඉස්ලාමීක නීතිය විශේෂ සැලකිල්ලක් දක්වයි. මෙයට ප්‍රධාන කාරණය නම් ඇයගේ නිර්මලත්වය, ගෞරවය හා නම්බුව ආරක්ෂා කොට ඉතාමත් උසස් තත්ත්වයක් ඇයට ලබා දීමේ අරමුණ ය. කාන්තාවන්ගේ ඇඳුම් පැළඳුම්, ඔවුන්ගේ රූප සුන්දරය හා ස්වභාව ලීලාව යනාදිය පිටට විදහා පෙන්වීමෙහි සීමාවන් පනවා ඇත්තේ ඔවුන්ගේ ම ආරක්ෂාව පිණිස ය; ඒවා තුළින් වැරදි ක්‍රියාවන් ඇතිවීම වළක්වා ලීම පිණිස ය; ඇත්ත වශයෙන් ම ඉස්ලාමය කාන්තාවන්ගේ නිදහසට පහර නොදෙයි; සීමාවන් ඇති නොකරයි. නමුත් ඔවුන්ගේ නිහතමානිත්වයට නින්දවක්, අපකීර්තියක් ඇතිවෙන්න ඉඩ නොදී, දැඩි ආරක්ෂාව තුළින් උසස් ස්ථානයක වැජඹීමට හැකි තත්ත්වයක් ඇතිකිරීම එහි අරමුණ වෙයි.*

---

1. සලාත් :- 'අල්ලාහ්ගේ ශාන්තිය ඔහුගේ වක්තෘ වූ මුහම්මද් (සල්) තුමාට ලැබේවා' යනු වේ. මෙහි තේරුම: අල්ලාහ්ගේ පැසසුම හා අහසේ ඉතා උසස් ස්ථානයේ වැජඹී සිටින මලායිකාවරුන්ට එතුමා ගැන කියා දීමද වේ.

*මෙම පොතෙහි, හිජාබය තුළින් කාන්තාවන්ට දී ඇති ආරක්ෂාවේ වැදගත්කම ගැන විස්තර කර ඇත. මේ වනාහි හිජාබ් ඇඳීමෙහි ඇලී සිටින, එයට ආශාකරන කාන්තාවන්ට, එය තවතවත් ක්‍රමානුකූලව පිළිපැදීමට තුඩුදෙයි. තව ද, කාන්තාවන්ගේ ලස්සන රුව පිටට විදහා පෙන්වීමේ අදහසින් අලංකාරවත් වීමේ භයානක විපත්තිය ගැන ද මෙහි කියා ඇත; මේවා සිතට ගෙන කටයුතු කිරීම යහපත් වේ. තවද, හිජාබය අතහැරීමෙන් දෙලොවෙහි ම ඇතිවෙන විපාකයන් ගැන මෙහි අනතුරු ඇඟවීමක් ද කර ඇත; මොහොතක් මේ ගැන සිතා බැලීම නුවණට හුරුය.*

*අල්ලාහ් අපගේ චේතානාවන් හොඳහැටි දන්නේ ය; ඔහු අපට සෑහේ; ඔහු ඉතා යහපත් ආරක්ෂකයා වෙයි.*

- ආචාර්ය සෙයික් මුහම්මද් බින් ඉස්මායිල්
- ආචාර්ය සාලිහ් අස් සාලිහ් (පරිවර්තන කර අර්ථ විවරණය ද ලියූ තැනැත්තා)

# හිජාබයේ වැදගත්කම!

## 1- කීකරුභාවයෙන් යුත් ක්‍රියාවක්!

හිජාබය වනාහි අල්ලාහ් (සු.ව)[2] ටත්, ඔහුගේ වක්තෘ වූ මුහම්මද් (සල්)[3] තුමාටත් කීකරුව කරනු ලබන ක්‍රියාවකි. අල්ලාහ් එය ඔහුටත් ඔහුගේ වක්තෘවරයාටත් කීකරුවීමේ කාර්‍යයක් බව හඳුනා දී ඇත.

අල්ලාහ් මෙසේ පවසයි:

﴿ وَمَا كَانَ لِمُؤْمِنٍ وَلَا مُؤْمِنَةٍ إِذَا قَضَى ٱللَّهُ وَرَسُولُهُۥٓ أَمْرًا أَن يَكُونَ لَهُمُ ٱلْخِيَرَةُ مِنْ أَمْرِهِمْ ۗ وَمَن يَعْصِ ٱللَّهَ وَرَسُولَهُۥ فَقَدْ ضَلَّ ضَلَـٰلًا مُّبِينًا ﴾ [الأحزاب، الآية ٣٦]

**"අල්ලාහ් සහ ඔහුගේ වක්තෘවරයා කිසියම් කාර්‍යයක් සඳහා තීන්දුවක් දුන්නේ ද, පසුව එම කාර්‍ය සම්බන්ධයෙන් තමන්ට විකල්ප තීන්දුවක් ගැනීමේ අයිතියක් දේව විශ්වාසය ඇත්තා වූ කිසිදු පුරුෂයෙකුට හෝ, කිසිදු ස්ත්‍රියකට හෝ නොමැත. තව ද, අල්ලාහ්ට හා ඔහුගේ වක්තෘවරයාට කවරෙකු අකීකරු වන්නේ ද, ඔහු පැහැදිලි වම දුර්මාර්ගයෙහි සිටියි."**

(අල් කුර්ආන් 33 : 36)

ඔහු තවත් පවසයි :

﴿ فَلَا وَرَبِّكَ لَا يُؤْمِنُونَ حَتَّىٰ يُحَكِّمُوكَ فِيمَا شَجَرَ بَيْنَهُمْ ثُمَّ لَا يَجِدُوا۟ فِىٓ أَنفُسِهِمْ حَرَجًا مِّمَّا قَضَيْتَ وَيُسَلِّمُوا۟ تَسْلِيمًا ﴾ [النساء، الآية ٦٥]

**"(මුහම්මද්!) ඔබගේ ස්වාමියා කෙරෙහි දිවුරා (පවසමි!) ඔවුනතර ඇතිවෙන ආරවුල් හි ඔබව විනිශ්චයකරු බව පිළිගෙන, ඔබ විසින් දෙනු ලබන තීන්දුව සම්බන්ධයෙන් ඔවුන්ගේ සිත් තුළ යම්කිසි අතෘප්තියක් නොමැතිව, සම්පූර්ණයෙන් එයට අවනත වනතෙක් ඔවුහු විශ්වාසිවන් නොවෙති."**

(අල් කුර්ආන් 4 : 65)

---

2. (සු. ව) සුබ්හානහු වතආලා: "කීර්තිය හා ශ්‍රේෂ්ඨත්වය ඇත්තා වෙයි" යනු මෙහි අදහස වෙයි.
3. (සල්) සල්ලල්ලාහු අලෛහි ව සල්ලම්: "අල්ලාහ්ගේ ශාන්තිය හා සමාදානය මුහම්මද් නබිතුමා වෙත ලැබේවා!" යනු මෙහි අදහස වෙයි.

කාන්තාවන් හිජාබ්[4] ඇඳිය යුතුයි යන්න අල්ලාහ්ගේ නියෝගයකි.

අල්ලාහ්ගේ නියෝගය අල්කුර්ආනයේ මෙලෙස විස්තර කර ඇත.

﴿ وَقُل لِّلْمُؤْمِنَٰتِ يَغْضُضْنَ مِنْ أَبْصَٰرِهِنَّ وَيَحْفَظْنَ فُرُوجَهُنَّ وَلَا يُبْدِينَ زِينَتَهُنَّ إِلَّا مَا ظَهَرَ مِنْهَا ۖ وَلْيَضْرِبْنَ بِخُمُرِهِنَّ عَلَىٰ جُيُوبِهِنَّ ﴾

[النور، الآية ٣١]

**"තව ද, (නබිතුමාණෙනි!) ඊමාන්ධාරී වූ කාන්තාවන් හට පවසන්න : ඔවුන් තමන්ගේ බැල්ම පහත හෙළිය යුතුයි; තමන්ගේ රහසඟ රැකගත යුතුයි; තමන්ගේ දේහ අලංකාරය (ස්වාභාවයෙන් පිටත පෙනෙන දේ හැර), නොපෙන්විය යුතුයි. තවද, තමන්ගේ පයෝධර උඩුරු සළුවකින් ආවරණය කර ගත යුතුයි."**

(අල් කුර්ආන් 24 : 31)

කවුරුන් හෝ තම රූ සපුව තවතවත් අලංකාරවත් කර ප්‍රදර්ශනය කිරීම වනාහි අඥානවත්, නුගත් ක්‍රියාවක් බව අල්ලාහ් සලකයි.

ඔහු මෙසේ උපදෙස් දෙයි:

﴿ وَقَرْنَ فِي بُيُوتِكُنَّ وَلَا تَبَرَّجْنَ تَبَرُّجَ الْجَاهِلِيَّةِ الْأُولَىٰ ﴾

[الأحزاب، الآية ٣٣]

"තව ද, ඔබගේ නිවෙස් හි රැඳී සිටින්න. පසුගිය අඥාන[5] සමයෙ හි මෙන් දේහ අලංකාරය ප්‍රදර්ශනය කරමින් නො ඇවිදින්න."

(අල් කුර්ආන් 33 : 33)

---

4. **හිජාබ්:** මෙය කිසියම් සංස්කෘතියකට අයත් එකක් බව අදහස් නොකළ යුතුයි. මෙය අල්ලාහ්ගේ නියෝගයක්, මේ සඳහා වූ කොන්දේසි අරාබික රයින්, ඊජිප්තුවන්, පකිස්තානුන්, කළු සුදු ඇමරිකානුන් යනු නොමැත. මෙහි අරමුණ වන්නේ කාන්තාවන්ගේ ආරක්ෂාවය. මෙය සඳහා වූ කොන්දේසි හා ක්‍රියා පිළිවෙළ කුර්ආනයෙහි ද සුන්නාහ්වෙහි ද සවිස්තර ව සඳහන් කොට ඇත. ස්ත්‍රීන්ට හා පුරුෂයන්ට යහපත් දේ කුමක් ද යනු ඔවුන්ව මැවූ අල්ලාහ්ට වඩා දන්නා තවත් කෙනෙකු නොමැත. ඔහු විසින් දෙනු ලැබූ ආගම (ජීවන පැවැත්ම, යහ මග) ඥානයෙන් පූර්ණය. එමෙන් ම, ඔහුගේ සෑම ක්‍රියාවක් ම ඥානයෙන් පිරී ඇත.
5. අල්ලාහ්, ඉස්ලාමයට පෙර කාලය ගැන මෙහි කියයි.

අල්ලාහ් මෙසේ ද පවසයි:

﴿ وَإِذَا سَأَلْتُمُوهُنَّ مَتَٰعًا فَسْـَٔلُوهُنَّ مِن وَرَآءِ حِجَابٍ ﴾ [الأحزاب، الآية ٥٣]

"නබිතුමාගේ භාර්යාවන්ගෙන් ඔබ යම් දෙයක් ඉල්ලන විට තිරයකට මුවා වී ඔවුන්ගෙන් ඉල්ලනු මැනව."

(අල් කුර්ආන් 33 : 53)

ඉහත සඳහන් කුර්ආන් වාක්‍යයන් නබි (සල්) තුමාගේ භාර්යාවන්ට පමණක් සීමාවූවක් නොවේ. මෙම වාක්‍යයන් ඊමාන්ධාරී වූ කාන්තාවන් සැවොමට ම පොදු වේ. පහත සඳහන් කුර්ආන් වාක්‍යයන් තවත් පැහැදිලි ව හා විස්තරව ඇත. අවධානයෙන් කියවා තේරුම් ගන්න.

﴿ يَٰٓأَيُّهَا ٱلنَّبِيُّ قُل لِّأَزْوَٰجِكَ وَبَنَاتِكَ وَنِسَآءِ ٱلْمُؤْمِنِينَ يُدْنِينَ عَلَيْهِنَّ مِن
جَلَٰبِيبِهِنَّ ذَٰلِكَ أَدْنَىٰٓ أَن يُعْرَفْنَ فَلَا يُؤْذَيْنَ ﴾ [الأحزاب، الآية ٥٩]

**නබිතුමාණෙනි! ඔබගේ භාර්යාවන්, ඔබගේ දියණියන්, තව ද, ඊමාන්ධාරීන්ගේ භාර්යාවන් ආදීන්ට කියන්න: ඔවුන් තමන්ගේ කබාය (හෝ ශරීරය සම්පූර්ණයෙන් ආවරණය වන අයුරින් අඳින ඇඳුම්) ඇඳගත යුතු බව. මෙය ඔවුන් හැඳින ගැනීමටත්, ඔවුන් හිංසා පීඩා වලින් සුරක්ෂිත වීමටත් ඉතාමත් යෝග්‍ය (පහසු) වන්නේ ය."** [6]

(අල් කුර්ආන් 33 : 59)

---

6. කිසියම් කීකරුභාවයක් හෝ විනීතභාවයක් නොමැති වල්බුරු නිදහස් විවෘත සමාජයන් හි කාන්තාවන් විඳින දුක වේදනාව කියා නොහැකි තරම් ය. සැම කෙනෙකු ම මේ ගැන මනාව දනිති: විවේචනය කරති: දෙස් කියති. නමුත් "මෙවන් දුක් ගැහැට කාන්තාවන්ට ඇතිවන්නේ කෙසේ ද?" යනු සිතන්නෝ ඉතා සුළු කොටසකි. අපට මැවීමේ නියම අරමුණ ගැන මනා වැටහීමක් ඇත්තෝ මේ ගැන අවබෝධ කර ගනිති. අල්ලාහ් ට සම්පූර්ණයෙන් අවනත වී ඉස්ලාමය අනුව ජීවත් වීමට හා ඔහුට පමණක් නැමදීමට ය අප මවා ඇත්තේ. මෙම අරමුණ කරා පියනගන්නේ කෙසේ ද යනු කුර්ආනයේ සවිස්තර ව සඳහන් කොට ඇත. එයින් ස්ත්‍රීන් හා පුරුෂයන් තමතමන්ගෙන් ගෞරවය, විනීතභාවය, නිහතමානීත්වය වැනි දේ රැකගෙන ජීවත් වන්නේ කෙසේ ද යනු දැනගත හැකිය. හිජාබ් ය ස්ත්‍රීන්ට ඉමහත් ගෞරවය හා ආරක්ෂාව ගෙනදෙයි. ඒ සමග ම, නරක, පාපකාරී අදහස් ඇත්තාවුන්ගේ බැල්මෙන් හා නොමනා ක්‍රියාවන්ගෙන් තමා බේරා ගැනීමට ද හැකි වනවා ඇත.

නබී (සල්) තුමා මෙසේ පැවසූ හ:

"الْمَرْأَةُ عَوْرَةٌ"

"කාන්තාව 'අව්රාහ් [7] වෙයි" (ඇය ආරක්ෂා කළ යුතුයි)"

## 2. හිජාබ් යනු 'ඉෆ්ෆාහ්' (විනීතභාවය) වේ!

අල්ලාහ් විසින් හිජාබය කාන්තාවන්ට අනිවාර්ය කර ඇත්තේ ඔවුන් තුළ පවිත්‍රතාවය, විනීත භාවය සහ යහපත් හැසිරීම යනාදිය ගෙන ඒම පිණිස ය. හිජාබය අකුරට ම පිළිපැදීමෙන් මෙම ගතිගුණයන්ගෙන් පිරුණු ජීවිතයක් ලැබෙනවාට සැක නැත. මෙසේ නැතිවිට නොයෙකුත් ප්‍රශ්න විටින් විට මතුවී ජීවිතය නරකාදියක් බවට පත් කරයි.

අල්ලාහ් මෙසේ පවසයි:

﴿ يَٰٓأَيُّهَا ٱلنَّبِىُّ قُل لِّأَزْوَٰجِكَ وَبَنَاتِكَ وَنِسَآءِ ٱلْمُؤْمِنِينَ يُدْنِينَ عَلَيْهِنَّ مِن جَلَٰبِيبِهِنَّ ذَٰلِكَ أَدْنَىٰٓ أَن يُعْرَفْنَ فَلَا يُؤْذَيْنَ ﴾ [الأحزاب، الآية ٥٩]

**"නබිතුමාණෙනි! ඔබගේ භාර්යාවන්, ඔබගේ දියණියන්, තව ද, විශ්වාසවන්තයන්ගේ භාර්යාවන් ආදීන්ට කියන්න: ඔවුන් තමන්ගේ කබාය (හෝ ශරීරය සම්පූර්ණයෙන්** ආවරණය වන අයුරින් අදින ඇඳුම) ඇඳ ගත යුතු බව. මෙය ඔවුන් හැඳින ගැනීමටත්, ඔවුන් හිංසා පීඩා වලින් සුරක්ෂිත වීමටත් ඉතාමත් යෝග්‍ය (පහසු) වන්නේ ය."

(අල් කුර්ආන් 33 : 59)

එනමුත්, තම රූප සුන්දරය නැතිවී ගිය, මහලු කාන්තාවන් තමන්ගේ පිටත ඇඳුම් ගලවා තැබීමටත්, තම මුහුණ, අත් ආදිය පිටත පෙනෙන ලෙස සිටීමටත්, අල්කුර්ආනය අනුමත කරයි. එසේ මුත්, ඔවුන් විනීතභාවයෙන් සිටිය යුතුයි යනු කියා ඇති බව ද අප අමතක නොකළ යුතුයි.

---

7. අබ්දුල්ලාහ් ඉබ්නු මස්ඌද් (රළි) තුමා දන්වන මෙම හදීසය ඉමාම් තිර්මිදී (රහ්) තුමා, තම 'තිර්මිදී' ග්‍රන්ථයෙහි සඳහන් කර ඇත. මෙය (හසන් - ගරීබ්) හොඳ - දුර්වල එකක් බව ඔහු කියා ඇත. (හසන් ගරීබ් යනු කීමෙන් සැලකෙන්නේ එම හදීසය දැන්වූවන්ගෙන් සෑමෝම හෝ එක් කොටසකට එක්කෙනෙකු පමණක් සිටීම ය.) තව ද, ඉමාම් සුයූති (රහ්) තුමා මෙය සත්‍ය හදීසයක් බව සඳහන් කරයි.

කුර්ආනය මෙසේ කියයි :

﴿ وَٱلْقَوَٰعِدُ مِنَ ٱلنِّسَآءِ ٱلَّٰتِى لَا يَرْجُونَ نِكَاحًا فَلَيْسَ عَلَيْهِنَّ جُنَاحٌ أَن يَضَعْنَ ثِيَابَهُنَّ غَيْرَ مُتَبَرِّجَٰتٍۭ بِزِينَةٍ ۖ وَأَن يَسْتَعْفِفْنَ خَيْرٌ لَّهُنَّ ۗ وَٱللَّهُ سَمِيعٌ عَلِيمٌ ﴾ [النور، الآية ٦٠]

**"කිනම් කාන්තාවන් තරුණ කාලය ඉක්මවා විවාහවීමේ ආශාව නැතිව සිටින්නියන් වන්නේ ද, එම කාන්තාවන් තම රූ සපුව නොපෙනෙන ලෙස, තම පිටත ඇඳුම් ගලවා තැබීම ඔවුන් වෙත කිසිම වරදක් නැත; නමුත්, ඔවුන් ද විනීතභාවයෙන් යුත් කාන්තාවන් ලෙස හැසිරීම ඔවුන්ට යහපත් ය. තව ද, අල්ලාහ් සියල්ල අසන්නේ ය; සියල්ල දන්නේ ය."**

**(අල් කුර්ආන් 24 : 60)**

ඇත්ත වශයෙන් ම, මහළු කාන්තාවන් වුවත් තමන්ගේ විනීතභාවය[8] රැකගෙන ජීවත් වීම ඉතා උතුම් බව අල්ලාහ් පවසයි. එය එසේ නම් තරුණියන් හා වයසින් අඩු කාන්තාවන් කෙසේ සිටිය යුතුයි ද යනු සිතා බැලීම ඉතා වැදගත් ය.

# 3 - හිජාබ් යනු 'තහාරා' (පවිත්‍රතාවය) වේ!

අල්ලාහ් හිජාබය අනිවාර්ය කිරීමෙන් ඔහුගේ 'හික්මා' නම් වූ ඥානය කෙතරම් ශ්‍රේෂ්ඨ ද යනු පෙන්වා ඇත.

අල්ලාහ් පවසයි:

﴿ وَإِذَا سَأَلْتُمُوهُنَّ مَتَٰعًا فَسْـَٔلُوهُنَّ مِن وَرَآءِ حِجَابٍ ۚ ذَٰلِكُمْ أَطْهَرُ لِقُلُوبِكُمْ وَقُلُوبِهِنَّ ﴾ [الأحزاب، الآية ٥٣]

**"නබිතුමාගේ භාර්යාවන්ගෙන් ඔබ යම්කිසි දෙයක් ඉල්ලන විට, තිරයකට මුවාවී ඔවුන්ගෙන් ඉල්ලනු මැනවි. ඔබගේ ද ඔවුන්ගේ ද සිතේ පවිත්‍රතාවය රැකීමට මෙය ඉතා යහපත් වේ."**

**(අල් කුර්ආන් 33 : 53)**

---

8. මෙම දේව වාක්‍යයෙහි, "අල්ලාහ් සියල්ල අසන්නේ ය: සියල්ල දන්නේ ය" යනු කියා ඇත. ස්ත්‍රී පුරුෂයන් හට සුමින දේ යහපත් වන්නේ ද යන්නට අදාළ සැමයක් ම අල්ලාහ් දන්නා බව කිසිදු සැකයක් නැත: තම අදහසට විරුද්ධ ව තැනී සිටීමට කිසිවෙකුට හැකි නොවේ. හිජාබ් ඇඳීම අල්ලාහ්ගේ අණසකි. එයින් ඇතිවන යහපත් විපාකයන් ගැන වූ ඔහුගේ ඥානය පරිපූර්ණ ය.

ඊමාන්ධාරීන් වන ස්ත්‍රීන් හා පුරුෂයන්ගේ සිත් හි පවිත්‍රතාවය ඇතිකිරීමෙ හි හිජාබය විශේෂ තැනක් ගන්නේ ය.

නෙතින් යමක් නොදකිනා විට, ඒ ගැන සිත් හි ආශාවන් ඇතිවන්නේ නැත. සමහර විට, නෙතින් දකින යමක් ගැන සිත් හි ආශාවන් ඇතිවන්නත් පුළුවන; නැතිවන්නත් පුළුවන. මෙය කෙසේ, වෙතත්, (හිජාබය තුළින්) බැල්මට යම් තිරයක් දැමීමෙන්, 'ෆිත්නා' නම් වූ නින්දිත කාර්‍යයන් (අවුල්) ඇතිවීම වළකාලිය හැකි වෙයි; තව ද, සිතෙහි නරක චේතනාවන් ඇත්තන්ට මෙය බාධකයක් ද වෙයි. කාලයාගේ ඇවෑමෙන් අධම සිත් ඇත්තෝ යහමඟට හැරී පවිත්‍රවීමට ද මෙය සුදුසු මාර්ගයක් වන්නේ ය.

අල්ලාහ් පවසයි:

﴿ فَلَا تَخْضَعْنَ بِالْقَوْلِ فَيَطْمَعَ الَّذِي فِي قَلْبِهِ مَرَضٌ وَقُلْنَ قَوْلًا مَّعْرُوفًا ﴾ [الأحزاب، الآية ٣٢]

**"මෘදුව (කාමුක හැඟීම් උද්දීපන වන අයුරින්) කථා නොකරනු මැනව. මක්නිසාද යත්, සිත් හි ලෙඩ (නරක චේතනාවන්) ඇති අය එයින් පෙළඹෙන්නේ ය."**

**(අල් කුර්ආන් 33 : 32)**

# 4 - හිජාබ් ආරක්ෂාව සඳහා වූ පලිහක් වේ!

නබී (සල්) තුමා පවසා ඇත:

" إن الله حيي ستير يحب السِتر "

**"ඉතාමත් ශ්‍රේෂ්ඨමත් වූ අල්ලාහ් 'හයියි' [9] සහ 'සිත්තීර්'[10] වෙයි. ඔහු 'හයා' (නම් වූ විනීතභාවය) සහ 'සිත්තීර්' (නම් වූ ආරක්ෂාව හා ආවරණය) යනාදිය ප්‍රිය කරයි."[11]**

---

**9. හයියි – අල්ලාහ් විනීතවන්තයෙකි: ඔහු තම දාසයන්ගේ අපිකරු ක්‍රියාවන්ගෙන් ඔවුන් ව මුදවනු නැත. අල්ලාහ්ගේ අවශ්‍යතාවය ඔවුන්ට ඇති කල්හි, ඔවුන් එළිපිට ම ඔහුට විරුද්ධ ව හැසිරෙයි. නමුත්, ඔහු (විනීතවන්තයෙක් හෙයින්) ඔවුන්ට, නින්ද කිරීමෙහි ලැජ්ජාවට පත් වී, ඔවුන් කළ වැරදි ගැන සිතා, පව් සමා අයැද සිටීම සඳහා, සමාව ඉල්ලීමේ දොරටුව විවෘත කොට තබා සිටියි. එසේ වූ නමුත්, ඔවුන් පාප ක්‍රියාවන් පැතිරවීමෙහිත්, සීකරුවීමෙහිත් අහංකාර ව අත්තනෝමතික ව කටයුතු කරන්නේ නම්, නියත වශයෙන් ම, අල්ලාහ් ඔවුන්ට දඬුවම් කිරීමට පසුබට නොවන්නෙකි.**

එතුමා මෙලෙස ද පවසා ඇත:

" إيما إمرأةٌ نزعت ثيابها في غير بيتها، خَرَقَ اللّه عزّ وجلَّ عنها سِترَها "

**"සිසියම් කාන්තාවක් තම නිවසේ හැර, (තවත් ස්ථානයක නොමනා කාර්යයක් සඳහා පෙනීසිටීන අදහස් ඇතිව) තම ඇඳුම් ගලවන්නේ නම්, ඇය අල්ලාහ්ගේ ආරක්ෂාව නැති කර ගනියි. "[11]**

මෙය වනාහි, එම ස්ථානයේ ඇයගේ ක්‍රියාව අනුව (යහපත් ක්‍රියාවක් නම්) ත්‍යාගයන් ද (අයහපත් ක්‍රියාවන් නම්) දඬුවම් ද ලැබෙන විලසින් සැකසී ඇත.

# 5 - හිජාබ් යනු තක්වාහ් (දෙවියන් කෙරෙහි බිය හා ආදරය) වේ!

අල්ලාහ් පවසයි:

﴿ يَـٰبَنِىٓ ءَادَمَ قَدْ أَنزَلْنَا عَلَيْكُمْ لِبَاسًا يُوَٰرِى سَوْءَٰتِكُمْ وَرِيشًا ۖ وَلِبَاسُ ٱلتَّقْوَىٰ ذَٰلِكَ خَيْرٌ ﴾ [الأحزاب، الآية ٢٦]

**"ආදම්ගේ දරුවෙනි ! නියත වශයෙන් ම, අප ඔබට ඔබගේ රහස්‍ය වසා ගැනීමටත්, අලංකාර වීමටත් සළුපිළි දුන්නෙමු. නමුත්, තක්වා' (දෙවියන් කෙරෙහි බිය හා ආදරය) නම් වූ සළුපිළි (එයට වඩා) උතුම් ය."**

(අල් කුර්ආන් 7 : 26)

---

10. සිත්තීර් - අල්ලාහ් 'සිත්තීර' වූවෙකි : අකීකරු වූ ක්‍රියාවන් හැංගැත්වීමේ පිළිවෙල අල්ලාහ් විසින් ප්‍රධානය කර ඇත. අල්ලාහ් අප්‍රමාණ උදව් උපකාර කරද්දීත් දාසයන් අකීකරු වී නොමනා ක්‍රියාවන් හි යෙදෙයි. අප කවුරුත් ඔහු වෙත හැරී, පශ්චාත්තාප වී, සමාව ඉල්ලා සිටීමේ අවස්ථාව ඔහු විසින් දී ඇත. පාප කාර්යයන් හැසිර යාම අප්‍රිය කරන තැනැත්තා කෙරෙහි අල්ලාහ් ආදරය දක්වයි: එමෙන් ම, තම පාප ක්‍රියාවන් එළිදරව් කරන්නන් හා අකීකරුව හැසිරෙන්නන් වන මුස්ලිම්වරුන්ට ආදරය නොදක්වයි. යම් මුස්ලිම්වරයෙක් තම සහෝදර මුස්ලිම්වරයෙකුගේ පාප ක්‍රියාවන් එළිදරව් නොකර, එම තැනැත්තාට අල්ලාහ්ගෙන් සමාව ඉල්ලා සිටින ලෙසට උපදෙස් දෙන්නේ ද, එම මුස්ලිම් තැනැත්තා වෙත අල්ලාහ් ආදරයදක්වයි. හිජාබ් ය අල්ලාහ්ගේ සතුටට ලක්වූවකි. කුමක් නිසා ද යත්, එය අන්‍යයන්ට කාන්තාවගේ රූ සපුව පෙන්වා පවී හැසිරවීම වළක්වාලන පළිහක් වන නිසා ය.

අද, ලොව වැඩි දෙනෙකුගේ ඇඳුම්, ශරීරයේ සුන්දරත්වය පිටත පෙන්වන විලාසිතාවලින් යුතු ව ඇත. විශේෂයෙන්, කාන්තාවන්ගේ ඇඳුම් ඉතාමත් වෙහෙස මහන්සි වී ඔවුන්ගේ ශරීරය වසා ගන්නා ලෙස සකස් වී ඇත. එනම්, ඔවුන් අඩ නිරුවත්ව ඇඳුම් අදින්නෝ ය.

නමුත්, ඊමාන්ධාරීන් වූ කාන්තාවන්ගේ ඇඳුම් ඉහත සඳහන් ඇඳුම් වලට වඩා හාත්පසින්ම වෙනස් ය. ඔවුන් තම අධිපති (අල්ලාහ්) ගේ අණ පිළිපැද තම ශරීරය ආරක්ෂා කර ගැනීමටත්, තම ශරීරයේ රහස් ප්‍රදේශ වසා ගැනීමටත් ඇඳුම් අදිත්. මේ වනාහි දෙවියන් කෙරෙහි බිය හා ආදරය දක්වන ක්‍රියාවකි.

# 6 - හිජාබ් යනු 'ඊමාන්' (විශ්වාසය) වේ!

අල්ලාහ්, අල් මුඃමිනාත් නම් වූ ඊමානයෙන් පිරුණු කාන්තාවන්ට හැර අන් අයට හිජාබ් ගැන කිසිවක් කීවේ නැත.

ඔහු නබි (සල්) තුමා හට මෙසේ පවසයි:

﴿ وَقُل لِّلْمُؤْمِنَاتِ ﴾ [النور، الآية ٣١]

"තව ද, (නබී තුමාණෙනි !) දේව විශ්වාසය (ඊමානය) ඇති (මුඃමින් වන) කාන්තාවන්ට පවසන්න.... "

(අල් කුර්ආන් 24 : 31)

---

11. මෙය – අබුදාවූද්, තිර්මිදි, අල් බෙයිහකී, අහ්මද්, සහීහ් අත්තිගාරි යනාදී ග්‍රන්ථයන්හි සඳහන් ව ඇත.
12. මෙය – අබුදාවූද්, අත්තිර්මිදී යනාදී ග්‍රන්ථයන් හි සඳහන් වී ඇත. මෙය හොඳ හදීසයක් බව ඉමාම් තිර්මිදී පවසයි.
13. (රළි) රළියල්ලාහු අන්හු: අන්හා: අල්ලාහ් එතුමා / එතුමිය පිළිගනිත්වා!
14. අබු සුලයිමාන් අල් කිතාබී, "සුනන් අත්තිගාරි" යට දුන් විවරණයෙහි මේ ගැන සඳහන් කර ඇති බව "මආලිම් අස්සුනන්" හි සඳහන් වී ඇත. වෙළුම : 4 : 376
15. ඉමාම් මාලික් (රහ්) තුමාගේ "මුඅත්තා" නම් වූ ග්‍රන්ථයේ (2 : 905 අරාබි) මෙය සඳහන් වෙයි. මෙම හදීසය පවසන්නාන්ගේ පෙළ "මුර්සල්" නම් වේ. මෙම පවසන්නාන්ගේ පෙළ හි එක් තැනක හෝ තැන් කිහිපයක කැඩීමක් ඇත. උදාහරණයක් වශයෙන්, "A" වෙනුවෙන් හෝ "B" වෙනුවෙන් හෝ "C" වෙනුවෙන් හෝ නබී (සල්) තුමා පැවසූහ, "" .................."" "C" නැමැත්තා නබිතුමාගෙන් මෙම හදීසය කෙළින් ම නොඇසුවේ නම් මෙය 'මුර්සල්' හදීස් නම් වේ. මෙම හදීසය ගැන ඉබ්නු හිබ්බාන් කියන විට "මෙහි ඇති හදීස් පවසන්නාන්ගේ පෙළ දෙවිරිහෙන් ම දුර්වල වේ" යනු කියයි.

තවත්, කුර්ආන් වාක්‍යයක මුඃමින් වන කාන්තාවන්,

﴿ وَنِسَآءِ ٱلْمُؤْمِنِينَ ﴾ [الأحزاب، الآية ٥٩]

**"ඊමාන්ධාරීන්ගේ භාර්යාවන් ............."**
යනු අමතන ලෙස අල්ලාහ් තම වක්තෘවරයාට අණ කරයි.

එක් වරක්, බනූ තමීම් ගෝත්‍රයට අයත් කාන්තාවන් පිරිසක් ආයිෂා (රළි)[13] තුමිය හමුවීමට ආවෝය. එවිට, එම කාන්තාවෝ සැහැල්ලු (විනිවිද පෙනෙන) ඇඳුම් ඇඳ සිටියෝය. මෙය දුටු ආයිෂා (රළි) තුමිය,

"ඇත්ත වශයෙන් ම ඔබ සැම ඊමාන්ධාරීන් වූ (මුස්ලිම්) කාන්තාවන් නම් (ඔබ ඇඳ සිටින) මෙම ඇඳුම් ඊමාන්ධාරීන්ට සුදුසු ඇඳුම් නොවන (බව දැනගන්න.) ඔබ ඊමාන්ධාරීන් (මුස්ලිම්) නොවන කාන්තාවන් වන්නේ නම් මෙම ඇඳුම් භුක්ති විඳින්න. (ඇඳගන්න)."[14] යනු කීවා ය.

# 7 - හිජාබ් යනු 'හයා' (ලජ්ජාව) වේ!

නබී (සල්) තුමා පවසා ඇත:

" إنَّ لكل دين خُلقاً، وخُلق الإسلام الحياء "

**"එක් එක් ආගමකට ම අයත් සදාචාරාත්මක පිළිවෙළක් ඇත. ඉස්ලාමයේ සදාචාරය 'හයා' (ලජ්ජා බිය ඇති එකක්) වේ."** [15]

නැවත වරක් එතුමා මෙසේ පැවසූහ:

" الحياء من الإيمان، والإيمان في الجنّة "

16. මෙය ගෙන දක්වන අල් තිර්මිදි (රහ්) තුමා 'මෙය විශ්වාස කටයුතු හොඳ හදීසයක් ය" යනු කියයි.
17. අබ්දුල්ලාහ් ඉබ්නු උමර් (රළි) තුමා, ගෙන දක්වන මෙම හදීසය අල් හාකිම් තුමාගේ "මුස්තද්රක්" (1/22 අරාබි භාෂාව) ග්‍රන්ථයෙහි සඳහන් කර ඇත. මෙය "විශ්වාස කටයුතු හොඳ හදීසයක් ය" යනු එතුමා කියා ඇත. අල් හාකිම්ගේ මෙම අදහස අල් තහබී තුමා සත්‍යයක් බව සහතික කර ඇත.

"ලජ්ජාව (බිය ඇති බව) ඊමානයේ අංගයකි. ඊමානය වනාහි ස්වර්ගය (ලබාදෙයි)." [16]

නැවතත් එතුමා මෙලෙස කීහ:

" الحياء والإيمان قُرنا جميعاً، فإذا رُفِعَ أحدُهُما رُفِع الآخر "

**"ලජ්ජාව සහ ඊමානය එකක් මත එකක් රැඳී පවතියි; මෙයින් එකක් (පිටත) ගතහොත් අනෙක බිඳ වැටෙයි."** [17]

විශ්වාසීන්ගේ මව වන ආයිෂා (රළි) තුමිය මෙසේ කියයි:

*"අල්ලාහ්ගේ වක්තෘවරයා සහ පසුව මගේ පියා භූමදාන කළ කාමරයට මම මගේ පිටත සළුව (Garment)නැතිව යාම සිරිතක් ව තිබුණේය. එවිට, මෙම දෙදෙනා මගේ ස්වාමි පුරුෂයා සහ පියා යන හැඟීම ය මට තිබුනේ. නමුත්, උමර් (රළි) තුමාගේ දේහය එහි භූමදානය කළ පසු, එතුමා වෙනුවෙන් මට ඇති වූ ලජ්ජාව නිසා මම මගේ පිටත සළුව නැතිව එම කාමරයට ඇතුල් වූයේ නැත."* [18]

මෙයින්, අන්‍ය පිරිමින් සමඟ තබා ගන්නා සම්බන්ධතාවය ගැන ආයිෂා (රළි) තුමිය දැරූ ආකල්පය කුමක් ද යනු වටහා ගත හැක. මෙලෙස, එක් කාන්තාවක් තුළ ස්වභාවයෙන්ම පිහිටා ඇති ලජ්ජා බයට එකඟවම හිජාබයත් හැඩගැසී ඇත.

# 8 - හිජාබ් යනු 'ගීරාහ්' (සිත් කනස්සල්ල) වේ!

මිනිසෙකු යහමඟ යන්නේ නම් ඔහුගේ ස්වභාවික හැඟීම් හා ක්‍රියාවන් පිවිතුරු වන්නේ ය; ඔහු වැරදි කිරීමෙන් වැළකී සිටින්නේ ය. එවැන්නෙක් තම භාර්යාව හෝ දූවරුන් අන්‍ය පිරිමින්ගේ බැල්මට ලක්වීම ප්‍රතික්ෂේප කරයි. හිජාබය මෙයට අදාළ එකකි. ගීරාහ් නම් වූ සිත් කනස්සල්ල මිනිසාට සංවරභාවය ඇතිකර, තම කාන්තාවන් අන්‍යයන්ගෙන් ආරක්ෂා කර ගැනීමට උදව් වෙයි.

---

18. මෙය, 'අස්සිම්ත් අත්තාමීම් පී මනාකිබ් උම්මුහාතුල් මූමිනීන්:' නම් වූ ග්‍රන්ථයෙහි (පිටු 91) සඳහන් වී ඇත. විශ්වාසධාරීන්ගේ මව්වරු (නබිතුමාගේ භාර්යාවන්) ගේ උසස් ගුණාංග එක්රැස්කර දෙන මෙම ග්‍රන්ථය ඉබ්නු අස්සාක්කිර් නමැත්තා විසින් තිම වූවකි. මෙම සිද්ධිය ගැන වෙනත් පොතක කියන අල් හයිසමී, ඉමාම් බුහාරී, ඉමාම් මුස්ලිම් වැනි අයගේ අදහස් අනුව 'මෙය පිළිගත හැක්කකි' යනු කියා ඇත. තවද , "මෙම ඉමාම්වරු දෙදෙනාම මේ ගැන කිසිවක් කීවේ නැත" යන්න ද ඔහු කියා ඇත. අල් හයිසමීගේ මෙම ප්‍රකාශයන් ගැන අන්තහවී කිසිවක් කීවේ නැත.

අද, ලොවෙහි බහුතර ජනතාව සංවරභාවයෙන් යුතුව කටයුතු කිරීම බොහෝ දුරට නැති වී ගොස් ඇත. එවැන්නන් අන්‍ය ස්ත්‍රීන් දෙස කාමුක ආශාවෙන් යුතුව බලයි. මොවුන් තම ස්ත්‍රීන් දෙස වෙනත් අය එලෙසම බැලීම ගැන කිසිදු අහිතක් සිතන්නේ නැත. වැඩි දෙනෙක් ඇඳුම් ඇඳ ඇතත් (නොඇඳපු ලෙස පෙනෙන) අඩ නිරුවත්ව සිටින ස්ත්‍රීන් සමඟ වාඩි වී විසිතුරු දේ බලා සතුටු වන බව ඔබ දකින්නට ඇත. තව ද, මොවුන්ගේ භාර්යාවන් එවැනි පරිසරයක තම ශරීරයේ රහස් ප්‍රදේශ පෙනෙන ලෙස අඩ නිරුවත්ව සිටීම හෝ ඔවුන් දෙස අනෙක් පිරිමින් රාගාධික බැලුම් හෙළීම ගැන හෝ කනස්සල්ලට පත් නොවෙයි. ඇත්ත වශයෙන් ම, එලෙස බලා දෙනෙත් පිනවීම හෝ සිතින් කාම සැප භුක්ති විඳීම ඔවුනට ප්‍රශ්නයක් බව හැඟෙන්නේ නැත. ඔවුන්ගේ අභ්‍යන්තර හැඟීම වන්නේ, 'අපට බලන්න හැකිනම් ඔවුනුත් බැලීමේ වරදක් නැත!' යන්න ය. මෙය මෙවැන්නන්ගේ ස්වාධීන වූ තේරීමකි.

මොවුන්ගෙන් ටික දෙනෙක් පමණය තම භාර්යාවන්ට වෙනත් පිරිමින් සමඟ නොමනා සබඳතාම ඇති බව දැනගතහොත් දුක් වන්නේ! එවිට, ඔවුන් කම්පනයට ලක් වෙයි; තම ගෞරවය, උසස් තත්ත්වය හා කීර්තිය සහ මුළින් ම නැති වූ බව සිතා වේදනාවට පත් වෙයි.

සමහර සමාජයන් හි මෙවැනි ප්‍රශ්න නිරාකරණය කර ගැනීමට පොලීසිය කැඳවයි. වෙන කිසිවක් ගැන නොතකා, 'ඝීරාහ්' නම් වූ සංවරභාවයෙන් යුත් සිත් කනස්සල්ල නැති මෙවැන්නන්ක්, 'දුගඳ වූ මඩ වගුරක ගිලිනී සිටින ඌරෙකුට' සමාන බව කිව නොහැකි ද?

වර්තමාන ලෝකයේ බොහෝ සමාජයන් හි මෙවන් නිරිසන් හැඟීම් වලින් යුත් ගුණ හා ක්‍රියාවන් ලැව් ගින්නක් සේ පැතිරීගෙන එන බව නොරහසකි.

අලි (රලි) තුමා කාන්තාවන් ටික දෙනෙක් හමුවූ විට මෙසේ පැවසූ හ:

*"වෙළඳ පොළෙ හි සිටින මුස්ලිම් නොවන කුෆ්ෆාර් (විශ්වාසවන්තයින් නොවන පිරිමින්) වෙත, කාන්තාවන් වූ ඔබ සැමවිටම එක් රොක් වන බව මට දැන ගැනීමට ලැබී ඇත. ඔබට 'ඝීරාහ්' (සංවරභාවයෙන් යුත් කනස්සල්ලක්) නැත්තේ ද? කවුරුන් වෙත 'ඝීරාහ්' (නම් වූ සංවරභාවය) නැත්තේ ද ඔවුන් වෙත යහපත් දේ කිසිවක් නැත. ඉස්ලාමය, 'ඝීරාහ්' ව විශ්වාසයට ඇතුළත් වූ කොටසක් ලෙස සලකයි."*

ඉස්ලාමයට අනුව, භාර්යාව, දියණියන් හෝ අනෙකුත් කිනම් මුස්ලිම් කාන්තාවක් වුවත්, ඔවුන්ගේ ගෞරවය, සදාචාරය නිසා ඔවුන්ව ආරක්ෂාකර ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම අනිවාර්ය ය. මෙයට අදාළ දේශනයන් හා ප්‍රායෝගික වැඩ පිළිවෙළක් ගෙන දෙන අගනා ජීවන සැලැස්මක් ඇත්තේ නම් එය ඉස්ලාමය පමණ ය.

# තබර්රුජ් ය (කාන්තාවන්ගේ වශීකරණය පෙන්වීම) තින්දුවකි!

## 1 - තබර්රුජ්[19] යනු අල්ලාහ් ට සහ ඔහුගේ වක්තෘවරයාණන්ට අකීකරුවීම වේ!

අල්ලාහ්ට සහ ඔහුගේ වක්තෘ (සල්) තුමාණන් ට කීකරු නොවන කෙනෙක්, තමාට ම හිංසා පීඩාව ඇති කරගන්නෙකු වෙයි. එසේ නැති ව, ඔහුගේ එම අකීකරුභාවයෙන් අල්ලාහ් ට කිසිදු හිංසාවක් පීඩාවක් ඇතිවන්නේ නැත.

නබි (සල්) තුමා මෙසේ පැවසූ හ:

" كل أمتي يدخلون الجنة إلى من أبى " فقالوا يا رسول الله من يأبى ؟ قال : " من أطاعني دخل الجنة، ومن عصاني فقد أبى "

***"මගේ 'උම්මත' (සමාජයට) ඇතුල් වූ සෑම කෙනෙක් ම ස්වර්ගයට ඇතුල් වෙයි, ප්‍රතික්ෂේප කළවුන් හැර! "එවිට, "යා රසූලුල්ලාහ්! ප්‍රතික්ෂේප කරන්නවුන් කවුරු ද?" යනු ඔවුහු (නබිතුමාගේ මිත්‍රයන්) ඇසූ හ. එයට පිළිතුරු දුන් නබි (සල්) තුමා, "කවුරුන් මට කීකරු වන්නේ ද ඔවුන් ස්වර්ගයට පිවිසෙයි: කවුරුන් මට අකීකරු වන්නේ ද ඔවුන් ය (එහි පිවිසීමට) ප්‍රතික්ෂේප කරන්නන් ! " යනු කීහ.***[20]

---

19. තබර්රුජ්:භාෂාව අනුව මෙහි තේරුම, "කාන්තාවකගේ රූ සපුව විදහා පෙන්වීම, ඇයගේ මුහුණ විදහා පෙන්වීම, ඇයගේ ශරීරයේ හැඩරුව පෙන්වීම, තම ස්වාමි පුරුෂයා හැර අන් පුරුෂයන් තමන් වෙත ලඟා කර ගැනීමට ගන්නා සෑම ප්‍රයත්නයක් ම කිරීම" යනාදිය වෙයි. ඉස්ලාමය අනුව මෙහි තේරුම නම්, "කාන්තාව තම රූ සපුව විදහා පෙන්වීම" යනු වෙයි. තවද, "ඇය තම ශරීරයේ හැඩ රුව පෙනෙන ලෙස (අන් අයගේ හැඟීම් ඇවිස්සෙන ලෙස) ඇවිදීම" නම් වූ තේරුමක් මෙයට ඇත. (අල් කමාර් 22/4) සමහරුන්ගේ අදහස අනුව, අන්‍ය පිරිමින්ට කැපී පෙනෙන අයුරින් සිටීමට කාන්තාවක් තමාට හැකි සෑම අන්දමකින් ම තම ශරීරය අලංකාරවත් කරගන්නේ ද, ඒ සෑමයක් ම "තබර්රුජ්" වෙයි." යනු තේරුම් වේ. "සමහර විට කාන්තාවක් අන් අයගේ සිත් හා බැල්ම ඇදගන්නා අදහසින් දීප්තිමත් පාටවලින් අලංකාර වූ හිස් වැස්මක් දමන්නේ නම් එයද ජාහිලිය්යා (අඥාන සමයේ) "තබර්රුජ්" නම් වූ වශීකරණ ක්‍රමයකි." (මව්ලානා මව්දූදි (රහ්) තුමාගේ "ද හිජාබ්" නම් වූ කෘතිය, පි: 132.
20. සහීහුල් බුහාරි, අරාබි ඉංග්‍රීසි පොත් පෙළ, වෙළුම: 9, හදීස් අංක : 384, පි: 284.

මුආවියා (රළි) තුමා, සිරියාවේ හමාස් නම් වූ ස්ථානයේ එක් රැස්වීමක් අමතා කතා කරන විට, නබි (සල්) තුමා කරුණු හතක් තහනම් කළ බවත්, එයින් එකක් ලෙස තබර්රුජය ගෙන දැක් වූ බවත් සඳහන් කළේය.[21]

"අබ්දුල්ලාහ් ඉබ්නු මස්ඌද් (රළි) තුමා මෙසේ පවසයි : "නබි (සල්) තුමා ගතිගුණ දහයක් ප්‍රියකළේ නැත. එයින් එකක් ලෙස නොහොබිනා තැනක තම රූ සපුව පෙන්වන තබර්රුජයද සඳහන් වෙයි." [22]

ඉමාම් සුයූති(රහ්) තුමා මෙසේ කීහ:

**" කාන්තාවක් තමන් අලංකාරවත් කර අන් අයට පෙන්වීම 'තබර්රුජ්' වෙයි. මෙය නින්දිත ක්‍රියාවකි. මෙයයි 'නොහොබිනා තැනක' යනුවෙන් ඉහතින් සඳහන් කොට ඇත්තේ. නමුත්, තම සැමියා වෙනුවෙන් අලංකාර වී ඔහුට තම සුන්දරත්වය පෙන්වීමෙහි වරදක් නැත."**

# 2 - තබර්රුජ් යනු භයානක, විනාශකාරී පාපයක් වේ!

රුකයියා නැමැත්තියගේ දියණිය වූ උමයිමාහ් ඉස්ලාමය පිළිගැනීමටත්, නබි (සල්) තුමා 'අල්ලාහ්ගේ වක්තෘ' බව විශ්වාස කිරීමටත් නබි තුමා වෙත ආවා ය. එවිට නබි (සල්) තුමා ඇය අමතා මෙසේ කීහ:

**"මගේ මෙම උපදෙස්වලට සවන් දෙන්න: 'ඔබ අල්ලාහ්ට අවනත වන කල්හි ඔහුට වෙනත් කොටස්කරුවන් එක් කළ නොයුතුයි; ඔබ සොරකම් නොකළ යුතුයි; ඔබ නොමනා ශාරීරික සම්බන්ධයන් හි හෝ විෂමචාරයෙහි හෝ යෙදිය නොයුතුයි; ඔබ ඔබගේ ළදරුවන් නොමැරිය යුතුයි; ඔබ ඔබගේ අත් හා පාදයන් අතර මිනාදූප නොකිව යුතුයි; ඔබ විලාප නගා ඇඬිය නොයුතුයි; ඔබ ජාහිලියා (ඉස්ලාමයට පෙර වූ ආඥාන) කාලයෙහි මෙන් 'තබර්රුජ්' (නම් වූ සිත් වසඟවන අසුරින් පෙන්වීම) නොකළ යුතුයි."**[23]

මෙහි, නබි(සල්) තුමා භයානක පාපකාරී ක්‍රියාවන් සමග තබර්රුජය ද එකතු කර ඇති බව පැහැදිළි ය.

---

21. ඉමාම් අහ්මද් තුමාගේ මෙම සටහන එතුමාගේ "මුස්නද්" ග්‍රන්ථයේ (4/101 අරාබි භාෂාව) ඇත.
22. "අන්නිසාඊ" පවසන මෙම හදීසය එතුමාගේ "සුනන්" අරාබි භාෂා (8/141) කෘතියෙහි සඳහන් වී ඇත.

## 3 - තබර්රුජ ය අල්ලාහ්ගේ ශාපයට ලක්වීමට සහ ඔහුගේ කාරුණික භාවයෙන් ඈත්වීමට හේතු වේ!

නබි (සල්) තුමා පැවසූ හ:

"سيكـون في آخـر أمتي نسـاءٌ كاسياتٌ عارياتٌ، على رُؤوسهنَّ كأسمنة البُخُت، إلعنوهُنَّ فإنَّهُنَّ ملعونات"

***"මගේ සමාජයේ, පසුකලෙක, කාන්තාවන් ඇඳුම් ඇද ඇතිමුත් (ඇත්තවශයෙන්) නිර්වස්ත්‍ර ව සිටියි; ඔවුන්ගේ හිස මත ඔටුවන්ගේ මොල්ලිය වැනි (හිසකෙස් අලංකාරවත් කර) ඇත. ඔවුන්ට ශාප කරන්න. නියත වශයෙන්, ඔවුන් ශාපයට ලක් විය යුත්තන් වේ."*** [24]

## 4 - තබර්රුජය නරකාදියේ සිටිනවුන්ගේ ගතිගුණ හා සමාන ය!

නබි (සල්) තුමා පැවසූ හ:

(صنفان من أهل النار لم أرَهُما : قومٌ معَهُم سياطٌ كأذناب البقر يضربون بها الناس، ونساءٌ كاسيات عاريات، مميلاتٌ مائلاتٌ، رؤوسَهُن كأسنمة البُخُت المائلة، لا يُدخلن الجنَّةَ، ولا يجدن ريحها، وإن ريحها ليوجد من مسيرة كذا وكذا)

23. ඉමාම් අහ්මද් තුමාගේ "මුස්නද්" (2/196) හි මෙය සඳහන් කර ඇත. අහ්මද් ෂාකිර් (රහ්) තුමා, "මෙම හදීසය පවසන්නන්ගේ පෙළ යහපත් ය," යනු කියා ඇත. තවද, එතුමා මෙසේ කියයි: "ඉබ්නු කදීර් (රහ්) තුමා තම තෆ්සීරයෙහි (8:327,328) මෙම හදීසය ගෙන දක්වා, "මෙම හදීසය පවසන්නන්ගේ පෙළ යහපත් ය" යන්න ද කියා ඇත. තව ද, මෙම හදීසය අත්තිර්මිදී, අන්නිසාඊ, ඉබ්නුමාජාහ් නම් වූ ග්‍රන්ථයන් සමග සම්බන්ධ කරයි.
* මෙම හදීසයට පහත සඳහන් කුර්ආන් වාක්‍යය සාක්ෂි දරයි:
නබිතුමාණෙනි! විශ්වාසවන්ත් වූ කාන්තාවන් දිවුරුම් දීම සඳහා ඔබ වෙත ඇවිත්, ඔවුන් අල්ලාහ් සමග වෙනත් යමක් සම නො කරන බවත්, සොරකම් නොකරන බවත්, විෂමචාරයේ නොහැසිරෙන බවත්, තමන්ගේ ළදරුවන් නොමරණ බවත්, තමන්ගේ අත් හා පාදයන් අතර මවා දූප නොකියන බවත්, කිසිම යහපත් කාර්යයකදී වුවත් ඔබට අකීකරු නොවන බවත් පොරොන්දුවන්නේ නම්, එවිට ඔවුන් ගෙන් වූ දිවුරුම් දීම පිළිගන්න (අල් කුර්ආන් 60:12)
ඉහත සඳහන් හදීසයෙහි සහ කුර්ආන් වාක්‍යයෙහි "අත් හා පාදයන් අතර මවාදූප නොකිවිය යුතුයි" යනු සඳහන් වෙයි. මේ ගැන විස්තරයක් දෙන "තෆ්හීමුල් කුර්ආන්" නම් වූ තෆ්සීරය මෙලෙස සඳහන් කරයි. "මෙහි සෝරුම දෙවර්ගයකට අයත් මවා දූප වේ. එකක් නම්, එක් කාන්තාවක්, අනෙක් කාන්තාවන් අන් පිරිමින් සමග නොමනා සබඳකම් පවත්වාගෙන යන බව අපවාද කීම: එවැනි කතා මිනිසුන් අතර පැතිරවීම. අනෙක: එක් කාන්තාවක් වෙනත් කෙනෙකුට දාව වැදූ ළදරුවෙක්, " මේ හිමියගේ ළදරුවා ය!" කියා තම සැමියා විශ්වාස කරලීම වේ."
(මව්ලානා මව්දූදී (රහ්) තුමා කුර්ආන් වාක්‍ය 60 : 12 යට දුන් විස්තරය.)

"නරකාදියේ සිටින මිනිසුන්ගෙන් මම කිසිවිටෙක නොදුටු කොටස් දෙකකට අයත් අය සිටිති. (ඔවුන්ගෙන්) එක් කොටසකට අයත් අය ගවයින්ගේ වලිග වැනි කස කඹා සිටිති. ඔවුන් එම කසවලින් (එහි සිටින) මිනිසුන්ට පහර දෙති. අනෙක් කොටසට අයත් අය නම් ඇදුම් ඇන්ද ද නිරු වස්ත්‍ර ව සිටින කාන්තාවන් ය. ඔවුන් නොමඟ ගිය අතර, ඔවුන්ගේ හිසෙහි මොල්ලියක් ලෙස උසට (අලංකාරවත් කළ) කෙස්වලින් අනෙක් අයද නොමඟ යවන්නෝය. මෙම කාන්තාවන් ස්වර්ගයට පිවිසෙන්නේ නැත. (එපමණක් නොව) ස්වර්ගයේ සුගන්ධය රස විඳින්න තරම් ලංව සිටියමුත්, එය ආඝ්‍රාණය කිරීමේ භාග්‍යය ඔවුන්ට හිමිවන්නේ නැත." [25]

# 5 - තබර්රුජ ය මරණින් පසු ජීවිතයෙ හි අන්ධකාරය ගෙන දෙයි!

නබි (සල්) තුමා පැවසූ හ:

"مثَلُ الرافلة في الزينة في غير أهلها، كمثل ظلمة يوم القيامة، لا نور لها"

"ලොවෙහි තම සැමියාට හැර (අන් කෙනෙක් වෙනුවෙන්) අලංකාර වත් වී ඇවිදින කාන්තාවගේ තත්ත්වය මරණින් පසු ජීවිතයෙ හි අන්ධකාරය මෙන් ය. එහි කිසිම ආලෝකයක් නොතිබෙයි" [26]

---

24. අල් මුජාම් අස්සකීර් ග්‍රන්ථයෙහි (8:232) ඇති මෙම හදීසය 'අත්තබරානි' පවසයි. අල් අල්බානි තම 'හිජාබ්' (8:56) ග්‍රන්ථයෙහි මෙම හදීසය සහාය එකක් බව පවසයි. ඉබ්නු අබ්දුල් බර් වෙනුවෙන් අස්සුයූති මෙසේ පවසයි: 'විනිවිද පෙනෙන ඇදුම් අඳින කාන්තාවන් තම ශරීරයේ සුන්දරත්වය පිටත පෙන්වන්නෝය යනු අල්ලාහ්ගේ වක්තෘවරයාණන් තුමා වදරා සිටියහ. ඇත්ත වශයෙන් ම ඔවුන් ඇදුම් ඇන්ද නිරුවස්ත්‍රව සිටින්නො වෙති.''
25. සහීහ් මුස්ලිම් ('දරුල් අරාබියා' හි ප්‍රකාශනයට පත්කළ ඉංග්‍රීසි පරිවර්තනය) වෙළුම: 4, හදීස් අංකය : 6840.
26. ඉමාම් තිර්මිදී තම 'සුනන්' හි (1167) මෙය සඳහන් කරයි. අල්බානි මෙය දුර්වල හදීසයක් බව කියයි. ඔහුගේ 'අල්ලයීෆා' (දුර්වල හදීස්) නම් වූ ග්‍රන්ථය (1800) බලන්න. අබූබකර් ජාබිර් අරබී (රහ්) තුමා මෙසේ කියයි: 'මෙම හදීසය සඳහන් කරන ඉමාම් තිර්මිදී "මෙය දුර්වල හදීසයක්" බව කියයි. නමුත් මෙහි ඇති අදහස නිවැරදි ය. එනම් අතිකරුණාවය ඇත්තෙන් ම හිංසාවක් හා වේදනාවක් වේ." මෙයින් අදහස් වන්නේ මෙවැනි කාන්තාවන් මරණින් පසු ජීවිතයේ දී කළු ශරීරයන් ඇති ව අඳුරේ අඳුරුවූවන් මෙන් එන්නෝ ය යන්නය. නමුත්, අල්ලාහ්ට අවනත වී හැසිරීමෙන් ලැබෙන වේදනාවන් සතුට හා උසස් තත්ත්වය ගෙන එන්නේය. මීට හේතුව නම්, ඔවුන් අල්ලාහ් ගේ සහ ඔහුගේ වක්තෘ (සල්) තුමාගේ තෘප්තියත් බලාපොරොත්තුව සිටින හෙයින් ය. උදාහරණයක් වශයෙන් මෙලොවෙහි උපවාසයේ පසුවන්නෙකුගේ මුවින් පිටවන සුවඳ නරක විය හැක. නමුත්, අල්ලාහ් වෙත එය කස්තූරි සුවඳටත් වඩා සුවඳය. මෙයට හේතුව, ඔහු අල්ලාහ්ට අවනතව ක්‍රියා කිරීමය. එමෙන් ම කාන්තාවක් අල්ලාහ්ට අවනතව හිජාබ් අඳිනවිට, "ඇය ප්‍රතිගාමී ය: පරණ කාලයේ කෙනෙකි: ඇවිදින කූඩාරමක් වැනිය!" යනු සමහරුන් කියන්නට පුළුවනි. නමුත් මරණින් පසු ජීවිතයෙහි ජය ගන්නේ ඇය ය. ඇයට බැනවැදුනු අය විපතට පත්වෙයි: ඔවුන් අල්ලාහ්ගේ ප්‍රකෝපයට ලක්වෙයි.

# 6 - තබර්රුජ ය 'නිෆාක්' (කපටිකම) වේ!

නබී (සල්) තුමා පැවසූ හ:

" خير نسائكم الودود، الولود، المواتية، المواسية، إذا اتقين الله، وشرُّ نسائِكم المتبرجات المتخيّلات، وهنَّ المنافقات، لا يدخل الجنة مِنهُنَّ إلاّ مثل الغراب الأعصم"

***"ඔබගේ කාන්තාවන්ගෙන් උතුම් අය වන්නේ දැඩි ආදරය හා දයාව, (සැමි සැනීමේ) සශ්‍රීකත්වය, (උදව් උපකාර කිරීමේ) කාරුණිකත්වය, අල්ලාහ්ට බිය ව කරුණු දැක්වීම යනාදිය ඇත්තෝ වෙති. ඔබගේ කාන්තාවන්ගෙන් ඉතා නරක අයවන්නේ මුතබර්රිජාත් (තම රූ සපුව ප්‍රදර්ශනය කරන කාන්තාවන්) වූවන් හා මුතඛයියලාත් (උඩඟු කම සහ ආඩම්බරය යනාදියෙන් යුතුව ඇවිදින කාන්තාවන්) වූවන් ය. ඔවුන් කපටින් වෙති. කිසිම අය ස්වර්ගයට පිවිසෙන්නේ ද ඔවුන් දුවිලි වැදුනු කපුටන් මෙන් ය."*** [27]

දුවිලි වැදුනු කපුටන් ට රතු හොටයක් සහ රතු පාදයන් ඇත. මෙය උපමාවකි. මෙම උපමාවෙන් කාන්තාවන්ගෙන් ඊක දෙනෙක් පමණ ය ස්වර්ගයට පිවිසෙන්නේ යනු පෙන්වා දෙනු ලැබේ. එනම් මෙවැනි කපුටන් ඉතා දුර්ලභ ය.

# 7 - තබර්රුජ ය නිච, අවනම්බුකාර ක්‍රියාවකි!

නබී (සල්) තුමා පැවසූ හ:

" أيُّما امرأةٍ وضعت ثيابها في غير بيت زوجها، فقد هتكت ستر ما بينها وبين الله عزّ وجلّ"

***"කිසියම් කාන්තාවක් තම ස්වාමි පුරුෂයාගේ නිවසේ හැර තවත් ස්ථානයක (හොමිනා ලෙස පෙනී සිටින අදහසින්) තම ඇඳුම් ගලවන්නේ නම් ඇය අල්ලාහ්ගේ ආරක්ෂාව නැති කර ගනියි"*** [28]

---

27. අල් බෛහකී නම් 'සුනන්' හි (7 වෙනි වෙළුම, පි:82) මෙය සඳහන් කරයි: 'අබූ අන්නයිම්' නම් 'අල් හිලියාත්' (8වෙනි වෙළුම, පි: 376) නම් වූ පොතෙහි ද, අබ්දුල්ලාහ් ඉබ්නු මස්ඌද් (රළි) තුමා මෙම හදීසය පැවසූ බව කියයි. අල්බානි ගේ 'හොද හදීසයන්. ............' (අරාබි) පොතේ 1849 හා 632 බලන්න.

28. ඉමාම් අහ්මද් පවසන මෙම හදීසය අල් හාකිම් නම් 'මුස්තද්රක්' නම් වූ (අරාබි) ග්‍රන්ථයෙහි සඳහන් කරයි. (වෙළුම:4, පි:288) මෙය බුහාරි, මුස්ලිම් ග්‍රන්ථ අනුව සත්‍ය හදීසයක් බවත්, අත්තහ බී, ඉබ්නුමාජාහ් යනාදීන් මෙය කෙරෙහි සිත යොමුකර ඇති බවත් මතු කියයි.

ඉමාම් අල් මන්නාවි (රහ්) තුමා මෙසේ කියයි: 'කිසියම් කාන්තාවක් තම ස්වාමි පුරුෂයාගේ නිවසේ හැර තවත් ස්ථානයක තම ඇඳුම් ගැලවීම' යනු නබි (සල්) තුමාගේ ප්‍රකාශයෙ හි තේරුම නම්. "තම ඇඳුම්වලින් අපේක්ෂිත ආරක්ෂාව නැතිකර අන්‍යයන්ට තම රූ සපුව පෙන්වීම" යන්න ය: තව ද, ඇය අල්ලාහ් ගේ ආරක්ෂාව ද නැතිකර ගන්නීය. **"ආදම්ගේ දරුවෙනි! නියතවශයෙන් ම, අප ඔබට ඔබගේ රහස් ප්‍රදේශ වසා ගැනීමටත්, ඔබට අලංකාරවත් වීමටත් සළුපිළි දුන්නෙමු. නමුත්, පවිත්‍රතාවය නම් වූ සළුපිළි (ඔබට) ඉතා උතුම් වන්නේ ය."** නම් වූ අල්ලාහ් ගේ වාක්‍යයන්ට විරුද්ධ ව හැසිරීමෙන් ඇය කෙරෙහි ඇති අල්ලාහ් ගේ ආරක්ෂාව නැතිවෙයි.

"එපමණක් නොවෙයි, ඇය තම ශරීරයේ වැසිය යුතු ප්‍රදේශ නොවසා, සංවරභාවයෙන් තොරව හැසිරීමෙන් තම සැමියාට ද ද්‍රෝහි වන්නීය. මෙයින් අල්ලාහ්ගේ ආරක්ෂාව නැතිවීම නියත යි. තව ද ඇය අවමානයට ද ලක්වෙයි. මෙලෙස ඇයගේ ජීවිතය අඳුරට පත් වී යයි."

# 8 - තබර්රුජ් ය නොයෙක් පාපයන්ට මඟ පෙන්වන මහා පාපයකි!

කාන්තාව (ගේ මුහුණ, අත් ආදිය සම්භරුන්ට පෙනෙනවා හැර ඇය[29]) ආවරණය වී සිටීම අවශ්‍ය ය. ඇයගේ ශරීරය මුළුමනින් ම පිටත පෙන්විය යුත්තක් නොවේ. එහෙයින්, ඇය තම රූ සපුව හා හැඩරුව අන්‍ය අයට පෙන්වීමේ චේතනාවෙන් ඇඳුම් ඇඳීම නීච, ලැජ්ජාවක් නැති ක්‍රියාවකි.

අල්ලාහ් මෙවැනි, නිර්ලජ්ජී වූ පාප ක්‍රියාවන්ගෙන් ඈත් වී සිටින ලෙස තමාට අවනතවන්නන්ට උපදෙස් දෙයි:

﴿ وَإِذَا فَعَلُوا۟ فَـٰحِشَةً قَالُوا۟ وَجَدْنَا عَلَيْهَآ ءَابَآءَنَا وَٱللَّهُ أَمَرَنَا بِهَا ۗ قُلْ إِنَّ ٱللَّهَ لَا يَأْمُرُ بِٱلْفَحْشَآءِ ۖ أَتَقُولُونَ عَلَى ٱللَّهِ مَا لَا تَعْلَمُونَ ﴾ [الأعراف، الآية ٢٨]

***"(අවිශ්වාසී වූ) ඔවුහු යම්කිසි විෂමාචාරයක් කර (එයින් වළකින්නැයි ඇඟවුවහොත්) 'අපගේ මුතුන් මිත්තන්ද මෙලෙස කිරීම අපි දැක්කෙමු; අල්ලාහ් මෙලෙස කරන මෙන් අපට අණ කෙළේ ය' යනු කියති. සැබැවින් ම අල්ලාහ් විෂමාචාර යන් කරන මෙන් අණ නොකරයි. (නබිතුමනි! අල්ලාහ් අණකළ දේ ද යනු) ඔබ නො දන්නා කරුණු සම්බන්ධයෙන් අල්ලාහ් බොරු කියන්නෙ හි දැයි ඔබ අසන්න."***

(අල් කුර්ආන් 7 : 28)

29. ඉදිරි පිටුවල මෙය විස්තර කර ඇත.

"ඇත්ත වශයෙන් ම ෂෙයිතාන් (සාතන්)ය මෙවැනි පාපකාරී ක්‍රියාවන් කිරීමට දිරි දෙන්නේ."

අල්ලාහ් පවසයි:

﴿ ٱلشَّيْطَٰنُ يَعِدُكُمُ ٱلْفَقْرَ وَيَأْمُرُكُم بِٱلْفَحْشَآءِ ﴾ [البقرة، الآية ٢٦٨]

***"ෂෙයිතාන් ඔබ වෙත එල්ල කරන්නේ දිළිඳුකමේ තර්ජනයයි. නිර්ලජ්ජ, ලෝභී ක්‍රියා කලාපයක් අනුගමනය කිරීමට ඔහු ඔබ පොළඹවයි"***

**(අල් කුර්ආන් 2 : 268)**

මුතබර්රිජාත් යනු පාප කාර්‍යයන් පතුරුවන විෂ බීජ වේ. මෙම විෂ බීජ මුස්ලිම් සමාජය තුළ නිර්ලජ්ජිව පාප ක්‍රියාවන් පතුරුවන්නට තරම් බල සම්පන්නය. අල්ලාහ් අවවාද කරයි:

﴿ إِنَّ ٱلَّذِينَ يُحِبُّونَ أَن تَشِيعَ ٱلْفَٰحِشَةُ فِى ٱلَّذِينَ ءَامَنُوا۟ لَهُمْ عَذَابٌ أَلِيمٌ فِى ٱلدُّنْيَا وَٱلْءَاخِرَةِ ۚ وَٱللَّهُ يَعْلَمُ وَأَنتُمْ لَا تَعْلَمُونَ ﴾ [النور، الآية ١٩]

***"නියත වශයෙන් ම, දේව විශ්වාසය ඇත්තන් අතර නින්දිත ක්‍රියාවන් (දුෂ්ට අදහසින් කියන අපවාදය) පැතිරිය යුතුය යනු කවරෙකු හෝ ප්‍රිය කරනාත්තේ ද, ඔවුනට මෙලොවෙහි ද මරණින් මතු ද වේදනාකාරී දරුණු දඬුවම් ඇත්තේ ය. තව ද, අල්ලාහ් සියල්ල දන්නේය ; ඔබ නොදන්නේ ය."***

**( අල් කුර්ආන් 24 : 19)**

ඇත්තෙන් ම, තබර්රුජ් යනු ස්ත්‍රී පුරුෂයන් අතර විෂමාචාරය ඇති කරන ප්‍රධාන කරුණක් වේ.

# 9 - තබර්රුජ් ය ෂෙයිතාන්ගේ මාර්ගය යි!

ආදම්* සහ හව්වා ** දෙදෙනාගේ ජීවිතයේ ඇති වූ සෑම ප්‍රශ්නයක් ම, අල්ලාහ්ගේ හතුරා වූ ෂෙයිතාන්ගේ කුට උපක්‍රමවලට සාක්ෂි දරයි. ඔහු ඔවුන්ගේ රහස් ප්‍රදේශ පිටත

---

* මිනිස් ඉතිහාසයේ පළමු මිනිසාය. මොහු අල්ලාහ්ගේ නබිවරයෙකි.

** හේ එම පළමු මිනිසාගේ බිරිඳ වේ.

පෙන්වන ආශාව ඇතිකර, නිච, නිර්ලජ්ජ වූ පව් පැතිරීමට තුඩු දුන්නේ ය. තව ද ෂෙයිතාන් කාන්තාවකගේ තබර්රුජය, තම නීච අරමුණු ඉටුකරගැනීමට ප්‍රයෝජනවත් කරගත් පළමු දෙය බව අප වටහා ගතයුතු ය.

අල්ලාහ් අවවාද කරයි:

﴿ يَـٰبَنِىٓ ءَادَمَ لَا يَفْتِنَنَّكُمُ ٱلشَّيْطَـٰنُ كَمَآ أَخْرَجَ أَبَوَيْكُم مِّنَ ٱلْجَنَّةِ يَنزِعُ عَنْهُمَا لِبَاسَهُمَا لِيُرِيَهُمَا سَوْءَٰتِهِمَآ ﴾ [الأعراف، الآية ٢٧]

***"ආදම්ගේ දරුවෙනි! ෂෙයිතාන් ඔබගේ දෙමාපිය දෙදෙනා, ඔවුන්ගේ රහස් අවයවයන් ඔවුන් දෙදෙනාට දැක ගැනීම පිණිස ඔවුන් නිර්වස්ත්‍රකොට, (ඒ හේතුවෙන්) ඔවුන් ස්වර්ගයෙන් බැහැර කළේ සෙසේ ද, එලෙසින් ඔහු ඔබ ව විපතට පත් නොකළ යුතුයි."***

(අල් කුර්ආන් 7 : 27)

මෙයින්, තබර්රුජ ය සඳහා වූ කැඳවීම ඇතිකර, කාන්තාවන්ගේ අලංකාරයන් පිටත පෙන්වීමේ කාර්යය ඇතිකළේ ෂෙයිතාන් බව පැහැදිලි ය. "කාන්තා නිදහස" නම් වූ නමින් වැරදි මාර්ගයකට කැඳවන නායකයින් සැමදෙනාට ම නායකයා ඔහුම ය. කරුණාන්විත අල්ලාහ්ට අවනත නොවී ෂෙයිතාන් ට අවනත වී ඔහු අනුගමනය කරන සැම දෙනාට ම 'ඉමාම්' (නායකයා) ඔහුම ය. ඇත්තෙන් ම කියනවා නම්, කවුරුන් මුස්ලිම්වරුන් නොමඟ යවා, ඔවුන්ගේ පරම්පරාවෙන් පැවත එන්නන් ද නොමඟ යැවීමට මාන බලන්නේ ද, ඔවුන්ගේ මඟ පෙන්වන්නා ෂෙයිතාන් ය.

නබී (සල්) තුමා මෙසේ පැවසූ හ:

" ما تركتُ بعدي فتنة هي أضر على الرجالِ من النساء "

***"මම කිසියම් ම 'ෆිත්නා' (හිංසා පීඩා)වක් තබා යන්නේ නැත. එහෙත් කාන්තාවන්ගෙන් පිරිමින්ට ඇතිවන 'ෆිත්නා' (හිංසා පීඩා) වක් හැර!"*** [30]

30. සහීහ් මුස්ලිම් (ඉංග්‍රීසි පරිවර්තනය / දරුල් ආරේබියා ප්‍රකාශනයක්) වෙළුම: 4, හදීස් අංකය: 6603, පි: 1431.

ආදම් (අලෙයි) තුමා අමතක වී එක් වරදක් කළ හ. ඒ සඳහා පශ්චාත්තාපයට පත් වූ හෙතෙම අල්ලාහ්ගේ සමාව අයැද සිටිය හ. කරුණාන්විත අල්ලාහ් එතුමාගේ ඉල්ලීම පිළිගෙන සමාව දුන්නේ ය. නමුත් ප්‍රශ්නය එතැනින් නිමවූයේ නැත. ආදම් හා ෂෙයිතාන් අතර වූ සටන නොනැවතී කෙරී ගෙන යයි. ෂෙයිතාන් අදත් ස්ත්‍රී පුරුෂයන් අල්ලාහ්ට අවනත වී හැසිරීමට ඉඩනොදී පව් කිරීමට පොළඹවයි. ඔහුගේ මෙම මාර්ගයෙන් ඈත් වී අපව බේරාගැනීමට නම් අල්ලාහ්ගේ උපකාරය පතා ඔහු වෙත යෑම විනා වෙන කළයුතු දෙයක් නොමැත. අල්ලාහ් වෙත දැඩි විශ්වාසයක් ඇතිව, අපගේ පව්වලට පශ්චාත්තාප වී සමාව අයැද සිටීමත්, අල්ලාහ් ගැනම සිතා, එතුළින් වැරදි පාප හැඟීම් දුෂ්ට චේතනා අතියම් ආශාවන් යනාදියෙන් අපව බේරා ගැනීමට ඔහු වෙතම රැඳී සිටීමත් අවශ්‍ය ය; අනිවාර්‍ය ය.

ඇත්ත වශයෙන් ම, ඉස්ලාමය නම් වූ සදාචාරාත්මක ජීවන සැලැස්ම නිසියාකාරව ම අප පිළිපදින්නේ නම් දෙලොවෙහි ම අපගේ ජීවිතය සුවිත මුදිත වීම නො අනුමාන ය.

# 10 - තබර්රුජ ය යුදෙව්වන්ගේ මාර්ගයකි!

රටවල් ගණනාවක් විනාශ කිරීමටත්, නොමඟ යැවීමටත් කාන්තාවන් අතකොළු බවට පාවිච්චි කළවුන්ය යුදෙව්වන්. ඔවුන් නොයෙකුත් සංවිධාන ඇතිකර ඒවා තුළින් අප්‍රමාණ ප්‍රයෝජන ලබාගැනීම සඳහා තබර්රුජ ය ප්‍රබල ආයුධයක් ලෙස පාවිච්චි කළ බව රහසක් නොවේ. මෙම කාර්‍යයෙහි ඔවුන් ට විශේෂ පුහුණුවක් හා පළපුරුද්දක් ඇත. යමෙකු තම පියවි ඇසින් ලොව දෙස යම්තම් බලන්නේ නම් චිත්‍රපටි ලොවක් වන හොලිවුඩ ය, විනාශකාරී සංවිධාන, නවීන පන්නයේ වූ ප්‍රසිද්ධ නවාතැන්, ලක්ෂ ගණන් අලෙවි වන සඟරා, දැන්වීම් හා වාර්තාවන් සපයන සංවිධාන යනාදිය කවර අය විසින් නඩත්තු කර ගෙන යනු ලැබේ ද යන්න දැනගත හැක. එපමණක් නොව, භයානක වැරදි වලට මඟ පෙන්වන චිත්‍රපට ද නොඔබිනා ඇඳුම් පැළඳුම් ද ඔවුන්ගේ පාලනය තුළ ඇත.

නබි (සල්) තුමා පැවසූ හ:

"فاتّقوا الدنيا، واتّقوا النساء، فإن أولَ فتنةِ بني إسرائيل كانت في النساء"

"මෙලොව ජීවිතය සම්බන්ධයෙන් සුපරීක්ෂාවෙන් සිටින්න. (එහි පෙළඹවීමෙන් ඔබ ව බේරාගන්න.) කාන්තාවන්ගේ ආකර්ෂණය මග හරින්න. (එයින් බේරී සිටින්න.) නියත වශයෙන් ම බනී ඉස්රායිලියන් හට වූ ප්‍රථම පිරිහැරය ඇතිවූයේ කාන්තාවන්ගෙන් ය."[31]

ඔවුන්ගේ ග්‍රන්ථ මෙයට සාක්ෂි දරයි. පහත සඳහන් වාක්‍යයන් කියවන්න:

"තව ද ස්වාමීන් වහන්සේ මෙසේ කියන සේක: සියොන් දූවරුන් උඩඟු ව, බෙල්ල උස්කොට, ඇස් කොනින් බල බලා, කොට පිය වර තබා ඇවිදිමින්, තමුන්ගේ පාදවලින් ශබ්ද නගමින් යන බැවින්, ස්වාමීන් වහන්සේ සියොන් දූවරුන්ගේ ඉස්මුදුනේ කබලු හටගන්වන සේක. ස්වාමීන් වහන්සේ ඔවුන්ගේ රහස නග්න කරන සේක."

(යෙසායා 3 : 16,17)

තවත් ඇත: කියවන්න,

"ඒ දවසේ ස්වාමීන් වහන්සේ ඔවුන්ගේ පා වළලුවල අලංකාරය ද, ඉස් දැල්ල චන්ද්‍රලෝකාභරණ ද, කුණ්ඩලාභරණ ද, අත් වළලු ද, මූව වස්නා ද, මකුට ද, පාද දම් ද, ඉන පටි ද, සෙප්පු ද, යන්ත්‍ර ද, මුදු ද, නාසාභරණ ද, මංගල්‍ය වස්ත්‍ර ද, සළු ද, උතුරු සළු ද, පසුම්බි ද, අත් කැඩපත් ද, සිහින් හණරෙදි ද, තලප්පා ද, ඇඟ වැසුම් ද පහකර දමන සේක."

(යෙසායා 3 : 18 – 23)

'කාපිර්වරුන් (මුස්ලිම් නොවන්නන්)ගේ පිය සටහන් අනුව නොයන්න. ඔවුන් ජීවත්වන අන්දම - විශේෂයෙන්, ඔවුන්ගේ කාන්තාවන්ගේ ඇඳුම් පැළඳුම් අනෙකුත් ක්‍රියාවන් ඔබගේ ජීවිතය තුළට පිවිසීමට ඉඩ නොදෙන්න.' නබි (සල්) තුමා කෙතරම් අවවාද කර ඇතත්, මුස්ලිම්වරුන්ගෙන් බොහෝ දෙනෙක් ඒ ගැන සැලකිලිමත් වන්නේ නැත.[31]

නබි (සල්) තුමාගේ අවවාදයක් මෙසේ ඇත:

" لتتبِعَنَّ سنَنَ من كان قبلكم شبراً بشبر وذراعاً بذراع، حتى لو دخلوا جحر ضب
لتبعتموهم، قيل: اليهود والنصارى؟ قال: فمن ؟"

31. සහීහ් මුස්ලිම් (ඉංග්‍රීසි පරිවර්තනය / දාරුල් අරේබියා ප්‍රකාශනය.) වෙළුම : 4, හදීස් අංක: 6606, පි: 1432.

***"ඔබ ඔබගේ මුතුන්මිත්තන්ගේ ක්‍රියා මාර්ගයන් අඟලෙන් අඟල, අඩියෙන් අඩිය අනුගමනය කරන්නේ ය. කොතරම් ද කියතොත්, ඔවුන් තලගොයි තුම්බයක් තුළට ඇතුළු වූවහොත් එහි ඇතුල්වන තරම ට (ඔබත් ඔවුන් අනුගමනය කරන්නේ ය)." එවිට නබි තුමාගේ මිත්‍රයෝ, "යා රසූලුල්ලාහ්! යුදෙව්වන් සහ ක්‍රිස්තියානින් ගැන ද ඔබතුමා සඳහන් කරන්නේ දැයි!" ඇසූහ. (මෙම ආගමික දෙකොටස හැර) වෙන කවුරුන් ගැන ද (මම සඳහන් කරන්නේ) යනු එතුමා පිළිතුරු දුන් හ."*** [32]

අල්ලාහ්ට සහ ඔහුගේ වක්තෘ (සල්) තුමාට කීකරු නොවන කාන්තාවන් යුදෙව්වන්ට සමාන වන්නේ ය. මක් නිසාද යත්, අල්ලාහ්ගේ අණ කෙරෙහි ඔවුන් දක්වන ආකල්පය හා සැලකිල්ල යුදෙව්වන්ගේ ක්‍රියාමාර්ගයන් ට සමාන වීම ය.

අල්ලාහ්, යුදෙව්වන්ට යමක් කිරීමට අණ කළ විට,

﴿ قَالُوا سَمِعْنَا وَعَصَيْنَا ﴾ [البقرة، الآية ٩٣]

***"අපි ඇහුම්කන් දුනිමු; එහෙත් අපි නොපිළිපැදිමු."***

(අල් කුර්ආන් 2 : 93)

යනු ඔවුන් උත්තර දුන් බව අල්ලාහ් කුර්ආනයේ සඳහන් කරයි. එහෙත්, ඊමාන්ධාරීයන් වූ කාන්තාවන් අල්ලාහ්ගේ අණට දුන් ඉමහත් ස්ථානය හා ගරුත්වය යුදෙව්වන්ගේ ක්‍රියා මාර්ගයට වඩා හාත්පසින් ම වෙනස් ය; විශේෂ ය; උත්කෘෂ්ට ය.

අල්ලාහ් ඒ ගැනත් සඳහන් කරයි. ඔවුන්ට යමක් ගැන අණ කළ හොත්,

﴿ وَقَالُوا سَمِعْنَا وَأَطَعْنَا ﴾ [البقرة، الآية ٢٨٥]

"අපි මාර්ගෝපදේශය ඇසීමු; ඊට අවනත ද වීමු." යනු කියයි.

(අල් කුර්ආන් 2 : 285)

32. අපගේ සමහරු කාෆිර්වරුන් ට අකැමැති යි: ඔවුන්ගේ යම් යම් ක්‍රියාවන් ප්‍රතික්ෂේප කරයි. නමුත් අපගේ ලෞකික අභිවෘද්ධිය සඳහා ඔවුන් අනුගමනය නොකර ම බැරි බව තරයේ විශ්වාස කරයි. එහෙයින්, කාෆිර්වරුන් කෙසේ රථපාන්නේ ද, ඇඳුම් අඳින්නේ ද? ආහාර ගන්නේ ද, නින්දට යන්නේ ද, ශරීරයේ අවයවයන් පද්දවමින් ඇවිදින්නේ ද ......... එලෙස ම මොවුහුත් කරන්න තැත් කරයි. ඇත්තෙන් ම මෙය වැරදි ක්‍රියා මාර්ගයකි. මුස්ලිම්වරුන්ගේ සියලු අභිවෘද්ධියක් ම ඔවුන් මෙලොව ට ආ අරමුණට එකඟව තිබිය යුතුයි යන්න අමතක නොකළ යුතුය. අපේ සෑම ක්‍රියාවක්ම අල්ලාහ් අනුමත කළ අන්දමින් තිබිය යුතුය. කාෆිර්වරුන් අල්ලාහ් විසින් දෙනු ලැබූ බොහෝ දේ ඔවුන්ගේ ලෞකික අභිවෘද්ධිය පමණක් ලබා ගැනීම පිණිස ප්‍රයෝජනවත් කර ගනියි. අපි එසේ නොවිය යුතුය. අප ව, අල්ලාහ් තුමක් සඳහා මැව්වේ ද යන්න හරිහැටි වටහාගෙන, ඔහුට අවනත වී, ජීවිතය ඉබාදතයක් (ඉස්ලාම් අනුව ම කරගෙන යා යුතු එකක්) ලෙස සිතා ජීවත් විය යුතු ය. අපි අල්ලාහ්ගේ අණ පිළිපදින්නේ ද? නැතිනම්කාෆිර්වරුන් අනුගමනය කරන්නේ ද? යනු සිතා බැලිය යුතුය. සමහරු අල්ලාහ් අනුමත කළ ඇඳුම් අඳිනවිට තවත් සමහරුන් එසේ නොකරන්නේ ඇයිදැයි කල්පනා කළ යුතුය. අපගේ ක්‍රියාවන් හි අල්ලාහ්ට අවනත වී සිටින්නේ නම් පමණය දෙලොවෙහි ම ජය ලබා ගැනීමට හැකි වන්නේ, මේ ගැන නිදහසේ සිතා බලන්න.

යම් කෙනෙක් අල්ලාහ්ගේ අණ නොපිළිපැද ඈත් වී සිටින්නේ ද ඔහුට අත්වෙන ඉරණම කුමක් ද යනු අල්ලාහ් විස්තර කරයි.

﴿ وَمَن يُشَاقِقِ ٱلرَّسُولَ مِنۢ بَعۡدِ مَا تَبَيَّنَ لَهُ ٱلۡهُدَىٰ وَيَتَّبِعۡ غَيۡرَ سَبِيلِ
ٱلۡمُؤۡمِنِينَ نُوَلِّهِۦ مَا تَوَلَّىٰ وَنُصۡلِهِۦ جَهَنَّمَۖ وَسَآءَتۡ مَصِيرًا ﴾ [النساء، الآية ١١٥]

"තව ද, යමෙක් යහමග ඔහුට පැහැදිලි වූවායින් පසුවත්, වක්තෘවරයාණන්ට විරුද්ධ ව හැසිරෙන්නේ ද, ඊමාන්ධාරීන්ගේ මාර්ගය නොවන මාර්ගය අනුගමනය කරන්නේ ද, අපි ඔහු යන දුර්මාර්ගයෙහි ම යවමු; පසු ව නිරයට ඔහු ඇතුලත් කරමු. එය ඉතා අයහපත් තැනකි."

(අල් කුර්ආන් 4 : 115)

## 11 - තබර්රුජ ය අපවිත්‍ර ජාහිලියියාවක් (නූගත් කමක්) වේ!

අල්ලාහ් මෙසේ පවසයි:

﴿ وَقَرۡنَ فِي بُيُوتِكُنَّ وَلَا تَبَرَّجۡنَ تَبَرُّجَ ٱلۡجَٰهِلِيَّةِ ٱلۡأُولَىٰۖ ﴾ [الأحزاب، الآية ٣٣]

***"තව ද, ඔබගේ නිවසේ රැඳී සිටින්න. පසුගිය අඥාන සමයෙ හි මෙන් අලංකාරය ප්‍රදර්ශනය කරමින් නො ඇවිදින්න."***

(අල් කුර්ආන් 33 : 33)

නබි (සල්) තුමා අඥාන කාලය අපවිත්‍ර වූත්, නපුරු හා පාප කාරිවූත් බව සඳහන් කර, එය ප්‍රතික්ෂේප කළ යුතු බව ද සඳහන් කළේය.

33. මෙම හදීසය වනාහි බුහාරි, මුස්ලිම් ඇතුළු තවත් අය විසින් පවසනු ලබන ප්‍රසිද්ධ හදීසයක් වේ. මෙහි සඳහන් කර ඇති හදීසය සහීහ් මුස්ලිම් ග්‍රන්ථයේ ඉංග්‍රීසි පරිවර්තනයෙ හි සඳහන් වූවක්. වෙළුම: 4, හදීස් අංකය: 6448, පි: 1403.

අල්ලාහ් මෙම නබි (සල්) තුමා ගැන මෙලෙස පවසයි:

﴿وَيُحِلُّ لَهُمُ ٱلطَّيِّبَٰتِ وَيُحَرِّمُ عَلَيۡهِمُ ٱلۡخَبَٰٓئِثَ﴾ [الأحراب، الآية ١٥٧]

***"තව ද, ඔහු ඔවුනට යහපත් දේ අනුමත කරන්නේ ය; අයහපත් දේ තහනම් කරන්නේ ය."***

**(අල් කුර්ආන් 7 : 157)**

**ජාහිලිය්යාහ් (අඥාන) කාලය කෙරෙහි කරන කැදවීමත්, තබර්රුජ් ය කෙරෙහි කරන කැදවීමත් එක හා සමාන වන්නේ ය. මෙම කැදවීම් දෙක ම ඉතාමත් නපුරු නින්දිත ඒවා බව ප්‍රකාශ කළ නබි (සල්) තුමා, මේ දෙක ම තහනම් කළේ ය.**

**නබි (සල්) තුමා මෙසේ පැවසුවේ ය.**

"كل شيء من أمر الجاهلية موضوع تحت قدميّ"

***"ජාහිලිය්යා වේ (අඥානයේ) සියලු දෙයක් ම මගේ පාදයන් ට යටත් වී ඇත."*** [34]

**තබර්රුජ් ය සහ ජාහිලිය්යාව (අඥානය)ට සම්බන්ධ වූ මමත්වය, අහංකාරකම, අල්ලාහ් ගැන වූ වැරදි අදහස්, මිථ්‍යාව කෙරෙහි වූ කැදවීම, පොලී ගනු දෙනු වැනි පාපකාරී ක්‍රියාවන් සියල්ලක් ම එකට එක්වූවන් ය. මේවායෙ හි තරාතිරම නොවෙනස් වේ.**

# 12 - තබර්රුජ ය තිරිසන් කමකි, බාදක හා පිරිහීම ගෙන දෙන්නෙකි!

**කිනම් දෙයක් වුව ද සම්පූර්ණයෙන් ම පිටත පෙන්වීම ත්, එලෙස ම, ක්‍රියා කිරීමත් තිරිසනුන්ගේ ස්වාභාවික ලක්ෂණයකි. යම් මිනිසෙකු මෙම තිරිසන් ලක්ෂණයට එකඟ ව හැසිරෙන විට, ඔහුට අල්ලාහ් දී ඇති උසස් මනුෂ්‍යත්වයෙන් පහත් තත්ත්වයට ඇද වැටෙන බව කිව හැක.**

---

**34. අබූදාවූද්, අත්තිර්මිදි, ඉබ්නුමාජාහ්, අත්තාරමී, ඉමාම් අහ්මද් යනාදීන් මෙය දන්වා ඇත.**

අල්ලාහ්, ස්ත්‍රී පුරුෂ සියලු දෙනාම තම ශරීරය වසා ගැනීම, එය වැරදි ක්‍රියාවල යෙදීමෙන් ආරක්ෂාකර ගැනීම, ගෞරවයෙන් සිටීම හා සංවරභාවය රැකගැනීම යනාදිය කෙරෙහි ස්වභාවිකව ම හැඟෙන මනසක් දී ඇත. එහෙත්, යමෙකු මේ දේ සිතට නොගෙන වැරදි මාර්ගයේ යන්නේ නම්, ඔහු ස්වභාවයට විරුද්ධ ව හැසිරෙන බව කිව යුතුයි. එයින් අත්වන ප්‍රතිඵලය පරිහානිය සහ අවමානය වේ.

මානව සභ්‍යත්වයේ අභිවෘද්ධිය වනාහි ස්ත්‍රී පුරුෂයන් සියලු දෙනා ම තම ශරීරයේ වැසිය යුතු ප්‍රදේශ වැසීමත් සමඟ කිට්ටු සම්බන්ධතාවයක් ඇත්තකි. ශරීරය වැසීම අභිවෘද්ධියේ ලකුණකි. හිජාබ් ඇඳීම සඳහා යම් කාන්තාවක් තුළ ඇතිවෙන විනීත භාවයෙන් පිරුණු සිත ආත්ම ශක්තිය තුළින් ලැබෙන වරප්‍රසාදයකි. අද පවත්නා "වැස්ම නම් වූ දම්වැල කඩාගෙන නිදහස ලබා ගැනීමට ඉදිරියට යමු!" නම් වූ උද්යෝග පාඨය වනාහි තබර්රුජ ය, ස්ත්‍රී පුරුෂයන් මිශ්‍රව හැසිරීම තුළින් ඇතිවෙන තරක හැසිරීම්, නිර්ලජ්ජභාවය, පහත් තත්ත්වයෙන් යුත් කාමාශාවන් යනාදිය තුළින් උපත ලැබූවකි.

කවරෙකු හෝ වේවා, මෙවැනි තත්ත්වයකට පැමිණුනුවිට, එයින් සතුටු වීමටත්, ඉහත සඳහන් මාර්ගයෙන් ලැබෙන ඉතා පහත් තෘප්තිය විඳ ගැනීමටත්, තමාගේ ලැජ්ජා බිය ගතිය අත්හැරීමට සිදුවෙයි; තමාගේ සංවරභාවය, පවිත්‍රත්වය සහ නිර්මලත්වය පිදුව යුතු වෙයි.

මේවායේ ප්‍රතිඵලය වන්නේ පිරිහීම ය; මානව සංහතිය ම තිරිසන් යුගයක් කරා පිය නැඟීම ය; අවසානයේ දී අප නොසිතූ නො පැතූ ඉරණමකට ගොදුරු වී විනාශයට අපි ළංවෙමු. අද ලොව ඇති රටවල් රාශියක් මෙම දුක්ඛිත තත්ත්වයට සාක්ෂි දරණ බව සැක නැත.

# 13 - තබර්රුජ් ය පාපයන්ගේ දොරටුව වේ!

ඔබ ඉතා අවධානයෙන් යුතු ව ඉස්ලාමයේ මූලාශ්‍රයන් (කුර්ආන් සහ සුන්නාහ් ව) කියවන්න; මානව ඉතිහාසය දෙස සිත යොමු කරන්න. එවිට, තබර්රුජ ය නිසා ලොවෙහි ඇති වූ හා පවතින පාප ක්‍රියාවන්, ආගමික හා ලෞකික කාර්යයන් හි සිදු වූ අනර්ථයන්, විශේෂයෙන් ස්ත්‍රී - පුරුෂයන් මිශ්‍රවීම තුළින් පව්, අපරාධ හා අනර්ථයන් දෙගුණ තෙගුණ වූ බව ඔබට දැනගත හැක.

එම අනර්ථයන්ගෙන් සමහරක් නම්:

අ) **කාන්තාවන් ගේ හැඩ රුව උලුප්කොට පෙන්වා පවත්වන රූ රැජින තරඟය:** මෙය මිනිසුන් නොමඟ යවන නින්දිත ක්‍රියාවකි. මෙයින්, මිනිසුන්ගේ සදාචාරය නැතිවී යයි. තව ද, කාන්තාව වෙළෙඳ භාණ්ඩයක් බවට පත් වී, පාපයන් පැතිරවීමේ ප්‍රබල මාධ්‍යයක් බවට පත් වෙයි.

ආ) **පුරුෂයන්, විශේෂයෙන් තරුණයන් හා තරුණ වියට පා තබන්නන් යනාදියගේ සදාචාරය හා සංවරභාවය නැතිවීම:** මෙයින් , ඔවුන් නොයෙකුත් නීච ක්‍රියාවන් ට ඇබ්බැහි වෙයි.[35]

ඉ) **පවුලේ සාමාජිකයන් අතර අවිශ්වාසය හා සැකය ඇති වී, පවුල් සංස්ථාව සිදී බිඳී දූෂිත තත්ත්වය උදාවීම:** මෙයින්, දික්කසාද වැඩිවෙයි; ළමයින් නොමඟ යයි.

ඊ) **දැන්වීම්, විනෝද උත්සවයන්, තවත් නොයෙකුත් විනෝදාංශයන් හි කාන්තාව කෙළි බඩුවක් බවට පත් කර අයුතු ප්‍රයෝජනයන් ලබා ගැනීම:** මෙයින් ප්‍රශ්න රාශියක් ඇති වන්නේ ය.

උ) **කාන්තාවන්ගේ සිත් තුළ යටපත් වී ඇති නරක සිතුවිලි, පාපකාරී හැඟීම් ආදිය අවුස්සා ඔවුන්ව නොමඟ යැවීම; ඔවුන්ගේ ගෞරවය හා විනීත භාවය දූෂ්‍යයන් හා සල්ලාලයන්ගේ අපහාසයන්ට ලක්වීමේ අවස්ථා එත් සලසා දීම:** මෙය වනාහි ලොව නිරයක් බවට පත්කිරීමක් ය.

ඌ) **භයානක සහ මාරාන්තික ලෙඩ රෝග පැතිර වීම.**
නබි (සල්) තුමා මෙසේ පැවසුවේ ය:

"لم تظهرِ الفاحِشَةُ في قومٍ قَط حتى يُعلِنوا بها إلاّ فشا فيهِم الطاعون والأوجاعُ التي لم تكنْ في أسلافِهِم الذين مَضَوْا"

---

35. යුරෝපයේ සහ දකුණු ඇමෙරිකාවේ නගරවල හි වීථිවල අස්සක් මුල්ලක් නැර අඩ නිරුවතින් වූ තරුණ තරුණියන් එක් වී දුම් බීම, මත් ද්‍රව්‍ය පාවිච්චි කිරීම, ලිංගික ක්‍රියාවන් යනාදියෙහි කිසිම පැකිළීමක් නැතිව යෙදෙන බව දකින්නට පුළුවන. ලෞකික ජීවිතය ස්වර්ගයක් මෙන් සිතා ජීවත්වන බොහෝ දෙනෙක් මේවායෙහි ඇති ඇත්ත නැත්ත වසං කිරීමට තැත් කරයි. මේ වනාහි නව යුගයේ තරුණ තරුණියන්ගේ, පෙප්සි, මයිකල් ජැක්සන්ලාගේ නැමදුමට ලක් වූ දෙවත්වයෙන් පිරුණු ජීවය. මෙලෙස හැසිරීමෙන් ආත්ම පරිහානිය, එඩ්ස් සහ සිපිලස් වැනි භයානක රෝග, ස්ත්‍රී දූෂණය සහ හිංසා පීඩාවන් පැතිරීම, අවජාතක ළදරුවන් ඉපදීමලොව සැමතැන බහුල වෙයි.

***"කිසියම් සමාජයක ප්‍රසිද්ධියේ ම පාපී ක්‍රියාවන් නොකෙරෙන්නේ නම්, ඒවා නොපැතිරෙයි. (එසේ පැතිරෙන) ඒවායේ ප්‍රතිඵලය වන්නේ, (එම සමාජයට අයත්) ඔවුන් ගේ මුතුන්මිත්තන් ගේ කාලයේ නොතිබූ වසංගතය වැනි භයානක රෝග ඔවුන් තුළ පැතිරයාමයි."*** [36]

ඩ) **ඇස්වලින් කෙරෙන විෂමචාරයට අවස්ථාවන් ඇති කර දීම:**
නබි (සල්) තුමා පැවසූ හ:

" العَيْنَان زِنَاهُما النظَر "

***"ඇස් මඟින් කෙරෙන විෂමචාරය නම් අනුරාගික බැල්ම වේ."*** [37]

ඪ) **තබර්රුජ් ය (යම් දෙයක් දෙස) ඔතෘකමින් බැලීම මඟහරවා ගැනීමේ දුෂ්කරතාවය ගෙන දෙයි:** මුස්ලිම්වරුන් තම බැල්ම පහත හෙළන ලෙස කුර්ආනය නියෝග කරයි. කුර්ආනයේ 24 : 31 වගන්තියේ ඇති එම නියෝගය බලන්න. එහෙත්, තබර්රුජ් ය එම නියෝගය ප්‍රතික්ෂේප කර, එයට විරුද්ධ ව හැසිරීමට තුඩු දෙයි.

ණ) **අල්ලාහ්ගේ දඬුවම් ගෙන එයි:** අල්ලාහ්ගේ දඬුවම් වනාහි පරමාණු බෝම්බයකින් භූමි කම්පාවකින් ඇතිවන විපත් වලටත් වඩා දරුණු ය; භයංකාරය.
අල්ලාහ් අවවාද කරයි:

﴿ وَإِذَآ أَرَدۡنَآ أَن نُّهۡلِكَ قَرۡيَةً أَمَرۡنَا مُتۡرَفِيهَا فَفَسَقُواْ فِيهَا فَحَقَّ عَلَيۡهَا ٱلۡقَوۡلُ فَدَمَّرۡنَٰهَا تَدۡمِيرٗا ﴾ [الإسراء، الآية ١٦]

36. මෙය ඉබ්නු මාජාහ්, අබූ නුඊම්, අල් හකීම් ආදීන් පවසන දීර්ඝ හදීසයක කොටසකි. මෙහි පවසන්නන්ගේ පෙළ යහපත් බව මොවුහු පවසති. අත්තහබී අල් හකීම්ගේ කීමත් සමග එකඟ වෙයි.
37. සහීහ් මුස්ලිම් (ඉංග්‍රීසි) වෙළුම : 4, හදීස් අංකය : 6421, පි : 1397

*"අප [38] නගරයක් (ජනයින්) විනාශ කරන්නට සිතුවේ නම්, එහි සුඛෝපභෝගී ව ජීවත් වන්නන් ට (අල්ලාහ් ට අවනත වී යහපත් අය වන ලෙස) අණ කරන්නෙමු. එනමුත් ඔවුහු එහි (එම අණ නොපිළිපැද) අපරාධ කරන්නෝ වෙත්. එවිට දඬුවම් දීමේ තීරණය, එම නගරවාසීන්ට එරෙහිව ගනු ලැබේ. (ඉතික්බිති ව) අපි එය (ඔවුන් ) සහමුලින් ම විනාශ කරනෙමු."*

(අල්කුර්ආන් 17 : 16)

නබි (සල්) තුමා පැවසූ හ:

إنّ النّاسَ إذا رأوا المنكَرَ فلَم يُغيّروهُ أوشَكَ أن يَعُمَّهُم اللّهُ بعذاب

*"මිනිසුන් වැරැද්දක් (අපරාධයක්) දැක එය (ඔවුන්) වැළැක්වූයේ නැතිනම්, එය අල්ලාහ්ගේ දඬුවම්, සියල්ලන් කෙරෙහි පොදුවේ එන බවට පෙර නිමිත්තකි."* [39]

---

38. 'අපි' යනු බහුවචනයෙන් කීම: එකම එක දෙවියෙක් වූ අල්ලාහ් ගේ ශ්‍රේෂ්ඨත්වය හා බල මහිමය ගෙන දැක්වීමට මෙලෙස කියනු ලැබේ. 'සැමිටික්' භාෂාවන් හි රජවරුන් වැනි උසස් තත්ත්වයේ සිටින්නන් අමතා කථා කරන විට මෙසේ කථා කර බව සඳහන් වේ.
39. අබූදාවූද්, තිර්මිදී, ඉබ්නුමාජාහ්, ඉමාම් අහ්මද් යනාදීන් මෙම හදීසය ගෙන දක්වයි.

# හිජාබ් අඳින්නන් සැලකිය යුතු අවශ්‍ය අනිවාර්ය කරුණු !

## 1 - ශරීරය සම්පූර්ණයෙන් වැසීම!

'හිජාබ් වෙත හැරීම - තෙවැනි කොටස' ග්‍රන්ථයේ කර්තෘ ග්‍රන්ථයෙහි, කාන්තාවන් තම මුහුණ සහ අතේ මැණික් කටුවෙන් පහළ කොටස වැසිය යුතුයි නම් වූ අදහස දරණ බව කියයි. තවත් සමහර විද්වතුන්, කාන්තාවන් තමන්ට ද තමන්ගෙන් අනෙක් අයට ද කිසියම් කරදරයක් ඇති නොවන අන්දමින් තම මුහුණ සහ අතේ මැණික් කටුවෙන් පහළ කොටස නොවසා සිටිය හැකි බව අදහස් කරයි. එහෙත්, අලංකාර රූ සපුවක් ඇති කාන්තාවක් තම මුහුණ සහ අතේ ආභරණ සහ ආලේප වලින් තව තවත් අලංකාර කර ගන්නා කල්හි, එම කාන්තාව ජීවත්වන සමාජය දූෂිත වී, එයට අයත් මිනිසුන්ගේ බැල්ම, කථාව සහ ක්‍රියාව ද නරක අතට හැරී ඇත්තේ නම්, එවිට ඇය තම මුහුණ ද අත් ද නොවසා සිටීම තහනම් කරනු ඇත.

## 2 - හිජාබ ය ප්‍රදර්ශනයක් නොවිය යුතුයි!

හිජාබ ය ප්‍රදර්ශන භාණ්ඩයක් නොවිය යුතුය. කාන්තාවන්ගේ රූව පිට ට නොපෙන්වීම එහි අරමුණ ය. අල්ලාහ් එය අනිවාර්‍ය කර ඇත්තේ ද එම අදහසින් ය.

අල්ලාහ් පවසයි:

﴿وَلَا يُبْدِينَ زِينَتَهُنَّ إِلَّا مَا ظَهَرَ مِنْهَا﴾ [النور، الآية ٣١]

***"තමන්ගේ රූ සපුව - එයින් පිටව පෙනන දේ හැර (අන් කිසිවක්) පිටත නොපෙන්වන්න."***

(අල් කුර්ආන් 24 : 31)

﴿وَقَرْنَ فِي بُيُوتِكُنَّ وَلَا تَبَرَّجْنَ تَبَرُّجَ الْجَاهِلِيَّةِ الْأُولَىٰ﴾ [الأحزاب، الآية ٣٣]

***"තව ද ඔබගේ නිවෙස් හි රැඳී සිටින්න. පසුගිය අඥාන සමයෙහි මෙන් අලංකාරය ප්‍රදර්ශනය කරමින් නො ඇවිදින්න."***

(අල්කුර්ආන් 33 : 33)

අල්ලාහ්ගේ මෙම වාක්‍යයන් අපගේ සැලකිල්ලට භාජන විය යුතුයි. හිජාබ් ය ශරීරය වසා ගැනීමට දෙනු ලැබුවකි. ඒ හැර, එය ප්‍රදර්ශනය කරන අලංකාරවත් දෙයක් නොවෙයි. මේ ගැන පිහි බුද්ධියෙන් කල්පනා කරන කාටත් වැටහෙනවාට සැක නැත.

## 3 - හිජාබ ය විතිවිද පෙනෙන එකක් නොව, ඝනකම් එකක් විය යුතුයි!

හිජාබ් ඇඳීමේ නියම අරමුණ එයින් ඉටුවිය යුතුයි. ඒ හැර, කාන්තාවකගේ ශරීරයේ හැඩ රුව පිටට පෙනන ලෙස තමට පමණක් සීමා වූ හිජාබයක් විතිවිද පෙනෙන වස්ත්‍රවලින් ඇඳීමෙහි කිසිම අර්ථයක් නැත. එය හිජාබ ය ඇඳගත් නිරුවත් කාන්තාවකගේ රූපය බව කිව හැක.

නබි (සල්) තුමා මෙසේ පවසා ඇත:

"سيكـون في آخـر أمتي نسـاءٌ كاسياتٌ عارياتٌ، على رُؤوسهنَّ كأسمنة البُخت، إلعنوهُنَّ فإنَّهُنَّ ملعونات"

*"මගේ සමාජයේ, පසුකලෙක, කාන්තාවන් ඇඳුම් ඇන්ද ද (ඇත්ත වශයෙන්) නිර්වස්ත්‍ර ව සිටියි; ඔවුන් ගේ හිස මත ඔටුවන්ගේ මොල්ලිය වැනි (හිසකෙස් අලංකාරවත් කර) ඇත. ඔවුන්ට ශාප කරන්න. නියත වශයෙන්, ඔවුහු ශාපයට ලක් විය යුත්තෝ වෙති."* [40]

එතුමා තවත් වරෙක මෙසේ පවසා ඇත:

زاد في حديثٍ آخر:

" لا يدخُلْنَ الجنَّة ولا يجدن ريحها، وإنَّ ريحها ليوجد من مسيرة كذا وكذا"

*"මෙම කාන්තාවන් ස්වර්ගයට නොපිවිසෙයි. (එපමණක් නොව) ස්වර්ගයේ සුගන්ධය රස විඳින්න තරම් ලං ව සිටිය මුත්, එය ආඝ්‍රාණය කිරීමේ භාග්‍යය ඔවුන්ට හිමිවන්නේ නැත."* [41]

---

40. අමෙර්ලිපි අංක 24 බලන්න.
41. අමෙර්ලිපි අංක 25 බලන්න.

මෙම අගනා උපදෙස් තුළින් අපට වැදගත් දෙයක් වටහා ගත හැකි ය. එනම්, සිනම් කාන්තාවක් විනිවිද පෙනෙන, ශරීරයේ හැඩරුව එලෙස ම පෙනෙන ඇඳුම් අඳින්නේ ද, එම කාන්තාව මහත් පාපයක් කරන්නී ය; එයින් ඇය මහත් විපතකට ලංවන්නීය යන බව ය.

# 4 - හිජාබය ශරීරයට තද එකක් නොවී බුරුල් එකක් විය යුතුයි!

හිජාබ ය හිංසා පීඩාවලින් සහ පාප කාර්යවලින් ආරක්ෂාව ගෙන දෙන එකක් ය. එනිසා එය ශරීරයට තද ව ඇත්තේ නම් එයින් ලැබිය යුතු ආරක්ෂාව නොලැබෙයි. එසේ ඇඳීමෙන් ශරීරයේ හැඩ රුව කැපී පෙනෙන්නේ නම්, එය හිජාබයට ප්‍රති විරුද්ධ ක්‍රියාවකි.

උසාමා බින් සයිද් (රළි) තුමා පවසයි:

قال أسامة بن زيد رضي الله عنهما: كساني رسول الله - صلى الله عليه وسلم قُبطِيّة كثيفة مما أهداها له دحية الكلبي، فكسوتها امرأتي، فقال "مالك لم تلبس القبطية؟ " قلت: كسوتها امرأتي، فقال: " مُرْها فلتجعل تحتها غُلالة وهي شعار يلبس تحت الثوب فإني أخاف أن تصف حجم عظامها.

***"නබි (සල්) තුමා, 'දුහියා අල් කල්බි' නැමැත්තාතුමාගෙන් තෑග්ගක් වශයෙන් ලැබුණු ඝනකම් කුබ්තියියාහ් නැමැති (ඊජිප්තුවේ නිම වූ කපු) ඇඳුමක් මට දුන්හ ය. මම එය මගේ බිරිඳට දුනිමි. නබි (සල්) තුමා, "ඔබ එම කුබ්තියියාහ් ව නොඇන්දේ මන් ද ?" යි විමසුවේය. මම, එය මගේ බිරිඳ ට දුන් බව කීවෙමි. (එවිට) එතුමා, (එය අඳින විට) ඇතුළෙනුත් ඇඳුමක් අඳින ලෙස (ඇයට) කියන්න. ඒ මන්ද යත් ඇයගේ ශරීර හැඩරුව (පිටත) පෙනෙන ලෙස එය තිබේවිදෝ යනු මම බියවෙමි යි"*** [42] කීවේය.

42. මෙම හදීසය අද්දියා අල් මක්දිසි, ඉමාම් අහ්මද්, අත් තබරානි, අල් බයිහකී, ඉබ්නු සඃද් යනාදීන් පවසයි. "මෙය පවසන්නාන්ගේ පෙළෙහි අබ්දුල්ලාහ් ඉබ්නු අකීල් ද ඔහුගේ පැවසුම් ද යනපත් ය. එහෙත් සමහර විද්වතුන්ගේ අදහස් අනුව, ඔහු වෙත මෙලකීනතාවය ඇති බවත්, අනෙක් පවසන්නාන්ගේ පැවසුම් විශ්වාස කළ හැකි බවත්" අල් හයිතමී පවසන බව වාර්තා කරනු ලැබේ. අත්තහබී, 'අබ්දුල්ලාහ් බින් අකීල් ගේ පැවසීමේ තරාතිරම 'හොඳයි' යනු කියන තරාතිරම ට වඩා පහත් වූව එකක් නොවෙයි" යනු කියයි. (මීසාන් අල් ඉතිදාල් නම් වූ අරාබි ග්‍රන්ථය.)

# 5 - හිජාබයේ සුවඳ විලවුන් ආලේප නොකළ යුතුයි!

නබී (සල්) තුමා පැවසූ හ:

"إيما امرأةٌ استعطَرَت، فمرَّت على قومٍ ليجدوا ريحها، فهي زانية"

***"කාන්තාවක් සුවඳ විලවුන් ආලේප කරගෙන, එය මිනිසුන් ආඝ්‍රාණය කරන ලෙස, ඔවුන් පසුකර යන්නේ නම් ඇය 'ෂානියා' (ගණිකා)වකි."*** [43]

# 6 - හිජාබය පිරිමින්ගේ ඇඳුම් මෙන් නොතිබිය යුතුයි!

නබී (සල්) තුමා පැවසූ හ:

"ليس منّا من تشبه بالرجال من النساء، ولا من تشبه بالنساء من الرجال".

***"පිරිමින් මෙන් ඇඳුම් අඳින කාන්තාවන්, කාන්තාවන් මෙන් ඇඳුම් අඳින පිරිමින් අප හට අයත් නොවූවන් වෙයි."*** [44]

අබූ හුරෙයිරා (රළි) තුමා පැවසූ හ:

وعن أبي هريرة رضي الله عنه قال:

"لعن رسول الله – صلى الله عليه وسلم – الرجل يلبس لبسة المرأة والمرأة تلبس لبسة الرجل..."

***"නබී (සල්) තුමා, කාන්තාවන්ගේ ඇඳුම් අඳින පිරිමින්ට ද, පිරිමින්ගේ ඇඳුම් අඳින කාන්තාවන්ට ද ශාප කළ හ."*** [45]

---

43. මෙම හදීසය ඉමාම් අහ්මද්, අන්නිසාඊ යනාදීන් පවසයි. මෙය පවසන අනෙක් කෙනෙකු වන අල් හකීම්, "මෙයට විශ්වාස කළ හැකි පවසන්නාන්ගේ පෙළක් ඇත" යනු කියයි. අත්තහබී මෙම අදහසට එකඟ වෙයි.
44. මෙම හදීසය ඉමාම් අහ්මද්, අබූ නරීම් යනාදීන් පවසයි. අල් අල්බානී තමාගේ 'හිජාබ්' නම් වූ ග්‍රන්ථයේ මෙය සත්‍ය එකක් බව පිළිගෙන ඇත. (පිටු අංක: 66,67 බලන්න.)

"නබි (සල්) තුමා, කාන්තාවන්ගේ ඇඳුම් අඳින පිරිමින්ට ද, පිරිමින්ගේ ඇඳුම් අඳින කාන්තාවන්ට ද ශාප කළ හ." [45]

නබි (සල්) තුමා නැවතත් පැවසුවේ ය:

"ثلاث لا يدخلون الجنّة، ولا ينظر اللّه إليهم يوم القيامة: " ألعاق والديه، والمرأة المترجلة المتشبهة بالرجال، والدَّيُّوث"

'තිදෙනෙක් ස්වර්ගයට පිවිසෙන්නේ නැත; අල්ලාහ් විනිශ්චය දිනයෙහි ඔවුන් දෙස බැල්ම හෙළන්නේ ද නැත. (ඔවුන් කවරෙකු ද යත්), තමාගේ දෙමව්පියන් ට කළයුතු යුතුකම් ඉටුනොකරන තැනැත්තන්, පිරිමින් මෙන් ඇඳුම් ඇද ඔවුන්ගේ ගති ගුණට සමාන ව හැසිරෙන කාන්තාවන්, තම බිරිඳ විෂමචාරයේ හැසිරෙන බව දැන දැනත්, (එය නැවැත්වීමට තැත් නොකර) එයට උදව් කරන්නන් (යන පිරිස වේ.)" [46]

## 7 - හිජාබ ය කාෆිර් (මුස්ලිම් නොවන) කාන්තාවන්ගේ ඇඳුම්වලට සමාන නොවිය යුතුයි!

නබි (සල්) තුමා පැවසුවේ ය:

"من تشبه بقوم فهو منهم"

"කවරෙකු කිනම් සමාජයක ට සමාන ව (තම කාර්යයන්හි) ජීවත්වේ ද, ඔහු ඔවුන්ගෙන් කෙනෙකු වෙයි." [47]

---

45. මෙය අබුදාවූද්, ඉබ්නු මාජාහ්, අල් හකීම්, ඉමාම් අහ්මද් යනාදීන් පවසයි. "ඉමාම් මුස්ලිම්ගේ අදහස අනුව මෙය සත්‍ය එකකි" යනු අල් හකීම් පවසයි. අත්තහබී මෙය පිළිගෙන ඇත. ඉමාම් නවවිද මෙය සත්‍ය එකක් බව පිළිගෙන ඇත.
46. මෙය අන්නිසාඊ, ඉමාම් අහ්මද්, ඉබ්නු කුසෙයිමා, ඉබ්නු හිබ්බාන් යනාදීන් පවසයි. මෙය සත්‍ය එකක් බව අහ්මද් ශාකිර් පවසයි.
47. අබුදාවූද්, අහ්මද් නම් වූ අය (වෙනත් හදීසයක කොටසක් වශයෙන්) මෙය කියයි. ඉබ්නු තයිමියියා (රහ්) තුමා මෙයට යහපත් (අබුදාවූද් දැක්වූ පරිදි) පවසන්නාන්ගේ පෙළක් ඇති බව ද, මෙය සත්‍ය හදීසයක් බව ද කියයි. අස්සුයුතී මෙය, 'හසන් - හොඳයි' යනු කියයි. ඉබ්නු හජර් මෙය 'ෆත්හුල් බාරී' ග්‍රන්ථයේ සදහන් කර, යහපත් පවසන්නාන්ගේ පෙළක් ඇති බව ද කියයි.

අබ්දුල්ලාහ් බින් උමර් (රළි) තුමා පැවසුවේ ය:

وعن عبدالله بن عمرو - رضي الله عنهما قال: " رأى رسول الله - صلى الله عليه وسلم- عَلَيَّ ثوبين معصفرين، فقال: "إن هذه من ثياب الكفار، فلا تلبسها"

***"මම කහ පාට ඇඳුම් දෙකක් ඇඳ සිටිම නබි (සල්) තුමා දුටුවේ ය. එවිට එතුමා, "මෙම ඇඳුම් කාෆිර්වරුන් (මුස්ලිම් නොවන්නන්)ගේ (සාමාන්‍යයෙන් නිතර අඳින) ඇඳුමකි. එම නිසා මෙය (ඔබ) නොඅඳින්න." යි කීවේය."*** [48]

# 8 - හිජාබය ප්‍රසිද්ධිය තකා අඳින්නක් නොවේ!

නබි (සල්) තුමා පැවසූ හ:

"من لبسَ ثوب شهرةً في الدنيا ألبسه الله ثوب مذلةٍ يوم القيامة، ثم ألهب فيه ناراً"

***"කවරෙකු ලෞකික ආශාව ඇති කරන ඇඳුම් අඳින්නේ ද, ඔහුට අල්ලාහ් මරණින් මතු ජීවිතයෙ හි නින්දා සහගත ඇඳුම් අන්දවන්නේ ය. පසුව, ඔහු ගින්නෙහි දමනු ලැබේ."*** [49]

පිරිමියෙක් හෝ කාන්තාවක් තමන් ව ප්‍රසිද්ධියට පත්කර ගැනීම පිණිස අඳින කිනම් ඇඳුමක් වුව ද, එය 'ප්‍රසිද්ධිය තකා අඳින ඇඳුමක් බව කිව හැක. එක් ඇඳුමක් අධික මිල දී ලෞකික ජීවිතය අහංකාරවත් ව, කාගේත් වර්ණනාවට ලක්වන පරිදි තබාගැනීමේ චේතනාවෙන් ගත හැක. නැතහොත් ලෞකික ජීවිතය ගැන වැඩි තැකීමක් නොමැතිව සාමාන්‍ය වාම් ඇඳුමක් ද තෝරාගත හැක. කෙනෙකු නොයෙකුත් වෛවර්ණ ඇඳුම් ඇඳ අනෙක් අයගේ ආකර්ෂණයට ලක්වීමටත්, ආඩම්බරයෙන් හැසිරීමටත්, මමත්වයෙන් පිපිරිමින් පුළුවන.

48. සහීහ් මුස්ලිම් (ඉංග්‍රීසි) වෙළුම: 3, හදීස් අංකය: 5173.
49. මෙය අබූදාවූද්, ඉබ්නුමාජාහ් දෙදෙනාම පවසයි. අල් මුන්දිරී සහ ඉබ්නු මෆ්ලිහ් මෙය 'හසන් - හොඳයි' යනු කියයි. ඉමාම් අස්සව්කානී "මෙම පවසන්නාන් විශ්වාස කළ යුත්තෝය" යනු කියයි. අල් අල්බානී, තම "හිජාබ්" ග්‍රන්ථයේ (පි: 110) මෙය "හසන් හොඳයි" යනු පවසයි.

ඇත්ත වශයෙන් ම, අල්ලාහ්ගේ තෘප්තිය වෙනුවෙන් තෝරා ගන්නා ඇඳුම් පමණය යහපත් වන්නේ! එය මෙලොව ජීවිතයෙ හි සදාචාරය, පිවිතුරත්වය සහ යහපත් තත්ත්වය ගෙනදෙයි. මරණින් මතු ජීවිතයෙ හි එය වෙනුවෙන් ලැබෙන ත්‍යාගයන් ද අනන්ත අප්‍රමාණ වේ.

# 9 - විදහා පෙන්වීමේ සැඟවුනු ක්‍රමයන්!

හිජාබ් ය ගැන මෙතෙක් ගෙන දැක් වූ විස්තර අනුව, එයට අදාළ වූ කොන්දේසි හා සීමාවන් මොනවාදැයි පාඨක සහෝදරයින් වටහා ගෙන ඇති බව සිතමු. නමුත්, අවාසනාවකට මෙන් තරුණ මුස්ලිම් කාන්තාවන්ගෙන් බොහෝ දෙනෙක් මෙම කොන්දේසි හා සීමාවන් පිළිගෙන හැසිරෙන බව නොපෙනෙයි. ඔවුන් දැන් අඳින ඇඳුම හිජාබ් ය බව වැරදි ව සිතාගෙන සිටිති. ඉස්ලාමයේ ප්‍රබෝධය නොරුස්සන අය හා එය ලොවින් තුරන්කිරීමට වෙහෙසෙන සතුරෝ හිජාබ් ය නැතිකිරීමට හැකි සෑම වෑයමක් ම කරති. එහෙත්, අල්ලාහ් ඔවුන්ගේ සියලුම ප්‍රයත්නයන් පරදවා, ඊමාන්ධාරීන් වූ ස්ත්‍රී පුරුෂයන් තමාට අවනත ව හැසිරීමෙ හි ස්ථිර ව සිටීමේ දැඩි සිතක් දුන්නේ ය.

මෙයින්, ඉස්ලාමයට විරුද්ධ ව කිසිවක් කිරීමට බැරි බව වටහාගත් සතුරෝ වෙනත් උපායයන් කෙරෙහි කල්පනා කරන්නට විය. ඉස්ලාමය වංචනික ලෙස යොදාගත් කුටෝපක්‍රම තුළින් මිස වෙනත් ක්‍රමයකින් නැතිකළ නොහැකි බව ඔවුහු සිතූහ. අල්ලාහ්ගේ තෘප්තිය තකා ඉස්ලාමය පිළිපදින මුස්ලිම්වරුන් වැරදි මාර්ගයන් හි යොමුකරලීමට ඔවුන් ගත් නොමනා පියවර එමට ය.

එමගින් ඇති වූවකි අළුත් ක්‍රමයේ හිජාබ ය. එක් අතකින් කාන්තාවන්ට 'අල්ලාහ්ගේ තෘප්තියට එකඟව හිජාබ් අඳින්නෙමුයි' නම් අදහස තම සිත් තුළ ඇතිකර ගැනීමටත්, අනෙක් අතින්, සමාජීය හැඟීම්වලට එකඟ ව, තමන්ගේ ශරීරයේ හැඩ රුව උලුප් කොට පෙන්වන ක්‍රියා මාර්ගයක් ගෙන හැසිරීමටත් මෙම අළුත් හිජාබය ඉඩ දුන්නේ ය.

එහෙත්, නියම ඉස්ලාමීය හිජාබ ය පැතිරෙන්න පටන්ගත් විට, නවීන පන්නයේ වෙළඳ පොළවල් හි වෙළඳුම්, ක්‍රමයෙන් පහත වැටීමට පටන් ගත්තේ ය. එවිට 'තබර්රුජ ය' අනුව හැඩගැසුනු වෙනත් හිජාබයන් 'නවක, සමකාලීන, ඇඳීමට පහසු ඒවා' බව හඳුන්වනු ලබා, පොදු වෙළඳ පොළ කරා ගෙන එනු ලැබුනේ ය. එහෙත්, සෑම පැත්තකින් ම මෙයට විරෝධ ව අදහස් ගලා එන්න විය. කාන්තාවෝ ද මෙයින් ප්‍රවේශම් වීමට වග බලාගත් හ.

මෙකල් හි, ඉස්ලාමීය හිජාබ ය නිසා සිත්තැවුල ට පත් ව සිටි, පුහු ආටෝපයට ලැදි රූප සුන්දරියන් සමූහයක්, එම නියම හිජාබ ය සැමතැන ම පැතිරීමෙන් ඇති වූ

සමාජ හැඟීමෙන් තමන් ව බේරා ගැනීම පිණිස, ඉහත සඳහන් අළුත් හිජාබ ය වෙත ඇදී ආහ. කාලයක් යනවිට මෙම අළුත් හිජාබ ය එම රූප සුන්දරියන්ගේ රූපය විදහා පෙන්වීමේ ක්‍රමයක් බවට පත් විය. මෙය ඇදගත් ඔවුන්, 'තමන් ඉතා හොඳ කාන්තාවන් බවත්, 'ඉතා හොඳ භාර්යාවන් බවත්' සිතන්නට වූහ.

එහෙත්, කවියෙකුගේ අදහස් අනුව ඔවුන්ගේ තත්ත්වය මෙයයි:

*"හිජාබය ව*
*ඔවුන් සම්බන්ධවන්නේ*
*ආරාධනාවක් නැතිව*
*ආදරය රැගෙන එන*
*අනාථයෙකු ව මෙන් ය!"*

මෙවැනි කාන්තාවන්ට අපි එක අදහසක් තරයේ ප්‍රකාශ කරන්න කැමති වෙමු. එනම්, කවර මිනිසුන් තමන්ගේ සිත් තුළ ඇති වැරදි අදහස් සඟවාගෙන, පිටතින් ඔබ ව ප්‍රශංසා කරන්නේ ද, ඔවුනට රැවටෙන්න එපා. අල්ලාහ් සහ ඔහුගේ වක්තෘ නබි (සල්) තුමා ඔබ සිත් හි රඳවා ගන්න. තව ද, 'තමාගේ සුන්දරත්වය අලංකාරය මුළුමනින් පෙන්වාගෙන ඇවිසරන කාන්තාවන්ට වඩා අපි උසස් වෙමු'යි සිතා ඔබව ඔබම රවටාගන්න එපා. ඇත්තෙන් ම, පාපකාරී ක්‍රියාවන්ට සමාව නැත. අපා ගින්නෙ හි විවිධ දඬුවම් ගෙනදෙන පහත් තරාතිරමෙන් යුත් ක්‍රම ඇත. එමෙන් ම, ස්වර්ගයෙ හි සැප හා සතුට ගෙනදෙන ඉතා උසස් තරාතිරමෙන් යුත් ක්‍රම ඇති බවත් අපි දැනගත යුතුය. එම නිසා, නියම ඉස්ලාමීය හිජාබයේ තතු නිසියාකාරව ම දැනගෙන, එය පිළිපදින ඔබගේ සහෝදරියන් අනුගමනය කිරීම විනා තවත් අගනා මාර්ගයක් ඔබට නැත.

නබි (සල්) තුමා පවසා ඇත:

"انظروا إلى من هو أسفل منكم في الدنيا، وفوقكم في الدين، فذلك أجدر أن لا تزدروا–أي تحتقروا – نعمة الله عليكم"

***'ලෞකික කාර්‍යයන් හි ඔබට වඩා පහත් තත්ත්වයේ සිටින්නන් දෙස බලන්න. ආගමික කාර්‍යයන් හි ඔබට වඩා උසස් තත්ත්වයේ සිටින්නන් දෙස බලන්න. එය ඔබට අල්ලාහ් ප්‍රදානය කර ඇති භාග්‍යයන් හි වැදගැම්මක් නොමැති බව නොසිතා සිටීමට අගනේ ය.'*** [50]

---

50. මෙම හදීසයේ මුල් වාර්තාව "අල් බුහාරි" ග්‍රන්ථයේ "රිකාක්" පාඩමේ ද, "මුස්ලිම්" ග්‍රන්ථයේ "අස්සුහ්ද්" පාඩමේ ද (ඉංග්‍රීසි වෙළුම: 4, හදීස් අංකය: 7070, පි: 1530), "අත්තිර්මිදි" ග්‍රන්ථයේ "කියාමාහ්" පාඩමේ ද සඳහන් වෙයි.

උමර් ඉබ්නුල් කත්තාබ් (රළි) තුමා පහත සඳහන් කුර්ආන් වාක්‍යය පාරායනා කළ බව 'අස්සුහ්ද්' පවසයි:[51]

وتلا عمر بن الخطاب رضي الله عنه قوله عز وجل: ﴿إِنَّ ٱلَّذِينَ قَالُواْ رَبُّنَا ٱللَّهُ ثُمَّ ٱسۡتَقَٰمُواْ تَتَنَزَّلُ عَلَيۡهِمُ ٱلۡمَلَٰٓئِكَةُ أَلَّا تَخَافُواْ وَلَا تَحۡزَنُواْ وَأَبۡشِرُواْ بِٱلۡجَنَّةِ ٱلَّتِي كُنتُمۡ تُوعَدُونَ﴾ [فصلت، الآية ٣٠]

***"අල්ලාහ් අපගේ අධිපති යා" යි යමෙක් පවසා එයි දැඩි ස්ථාවරයෙන් සිටින්නේ ද, නියත වශයෙන් ම, ඔවුන් වෙත මලායිකාවරු පහළ වන්නෝ ය. තව ද, (එම මලායිකාවරු) ඔවුනට "බිය නොවන්න: දුක් නොවන්න; ඔබ ට පොරොන්දු වී ඇති ස්වර්ගය පිළිබඳ වූ ශුභ ආරංචියෙන් සතුටුවන්න! (යනු කියයි.)"***

(අල් කුර්ආන් 41:30)

පසුව, එතුමා කීවේ ය:

فقال: "استقاموا والله لله بطاعته، ولم يروغوا روغان الثعالب"

***"අල්ලාහ් ගේ නාමයෙන්, ඔවුන් අල්ලාහ් ට කීකරු වී ඔහුගේ ඍජු මාර්ගය අනුගමනය කළේය. එසේ නැති ව (ඔවුන්) වෘකයන් මෙන් බොරුවට අහවාගෙන සිටියේ නැත."***

හසන් අල් බසරි (රහ්) තුමා කී හ:

***"ඔබ අල්ලාහ් ට සම්පූර්ණයෙන් අවනත වී ඔහුගේ මාර්ගයේ නොනැවතී යන බව ෂෙයිතාන් දකින්නේ නම් (ඔබ ට නොමඟ යවන්න) විටින් විට ඔහු මඟක් සොයන්නේ ය. එහෙත්, ඔබ ඔබගේ යහමඟ හි ස්ථිර ව සිටින බව ඔහු දකින්නේ නම්, ඔහු වෙහෙසට පත් වී ඔබ ට (නොමඟ යවන උත්සාහයෙන්) ඈත් වෙන්නේ ය. එනමුත්, ඔබ එක් විතාවක් යහමඟ හි ස්ථිර ව සිටි මෙන් (පසුව) වෙනත් විතාවක දුබලවන්නේ නම්, එවිට ඔහුගේ මාර්ගයෙහි ඔබ ව ගෙනයන්න ආශාව ඇති කරගන්නා වන්නේ ය."***[52]

---

51. ඉමාම් අහ්මද් තුමාගේ "අස්සුහ්ද්" නම් වූ ග්‍රන්ථයෙ හි ඉමාම් අහ්මද්, ඉබ්නු අල් මුබාරක් යනාදීන් වාර්තාකර ඇත. (පි: 110, 115 බලන්න.)
52. ඉබ්නු අල් මුබාරක් තුමාගේ "අස්සුහ්ද්" නම් වූ ග්‍රන්ථයෙහි (පි: 7, අංක: 20) වාර්තා කරයි.

***එහෙයින්, කිසිදු ඇල හැරීමක්
නොමැති යහමඟ (ඉස්ලාමය) දෙස පිය නගනැග, මෙහි
යහපත් ජීවිතයක් සඳහා වූ මඟ පෙන්වීමක් ඇත. තමන්ගේ
වැරදි, පාප ක්‍රියා ගැන සිතා පශ්චාත්තාපයට පත් වී එන
අයට මෙහි සහනය ඇත.***

අල්ලාහ් පවසයි:

﴿ وَتُوبُوٓاْ إِلَى ٱللَّهِ جَمِيعًا أَيُّهَ ٱلۡمُؤۡمِنُونَ لَعَلَّكُمۡ تُفۡلِحُونَ ﴾ [النور، الآية ٣١]

***"විශ්වාස වන්තයෙනි! ඔබ සැම එක් වී පශ්චාත්තාපයෙන් යුතුව අල්ලාහ් වෙත් සමාව අයැද සිටින්න. ඔබට ජය අත්වන්න පුළුවන."***

**(අල් කුර්ආන් 24 : 31)**

# සවන් දෙමු; සාදරයෙන් පිය තගමු!

ඉතා යහපත්, සැබෑ මුස්ලිම්වරුන් වෙත අල්ලාහ්ගේ ආඥාවන් ලැබුණු විගස, ඔවුන් ඒවා මැනවින් අවබෝධ කර ගැනීමට උත්සාහ දරයි; ඉනික්බිතිව, ඉස්ලාමය කෙරෙහි ආශාවෙන් හා භක්තියෙන් යුතුව, නබි (සල්) තුමාගේ සුන්නාහ් ව දැනගෙන ජීවත් වන්න පෙළඹෙයි. මොවුන්, තම ජීවිතයේ අරමුණ නොදැන ජීවත් වන මිනිසුන්ගේ වැරදි, තමන්ට පාඩුව ගෙනදෙන මාර්ගයන් ගැන සිත යොමු නොකරයි. අල්ලාහ්, තමාට සහ තම වක්තෘවරයාට පිටුපාන්නන්ගේ විශ්වාසය ප්‍රතික්ෂේප කරයි.

අල්ලාහ් පවසයි:

﴿ وَيَقُولُونَ ءَامَنَّا بِٱللَّهِ وَبِٱلرَّسُولِ وَأَطَعْنَا ثُمَّ يَتَوَلَّىٰ فَرِيقٌ مِّنْهُم مِّنۢ بَعْدِ ذَٰلِكَ وَمَآ أُوْلَـٰٓئِكَ بِٱلْمُؤْمِنِينَ(٤٧) وَإِذَا دُعُوٓاْ إِلَى ٱللَّهِ وَرَسُولِهِۦ لِيَحْكُمَ بَيْنَهُمْ إِذَا فَرِيقٌ مِّنْهُم مُّعْرِضُونَ﴾ [النور، الآية ٤٧، ٤٨]

***"අපි අල්ලාහ් ද වක්තෘවරයා ද විශ්වාස කෙළෙමු; ඔවුනට කීකරු ද වෙමු" යනු ඔවුහු කියති. එහෙත්, එයට පසුව, ඔවුන්ගෙන් පිරිසක් (කීකරු නොවී) ප්‍රතික්ෂේප කරති. එබැවින් මොවුන් සැබෑ මුඃමින්වරු නොවෙති. ඔවුන් අතර හටගන්නා ආරවුල් වල දී (අල්ලාහ්ගේ) වක්තෘවරයා විසඳුම් උබාදීම පිණිස, අල්ලාහ් වෙත ද, ඔහුගේ වක්තෘවරයා වෙත ද කැඳවනු ලැබුවහොත් ඔවුන්ගෙන් පිරිසක් ප්‍රතික්ෂේප කර යති."***

**(අල් කුර්ආන් 24 : 47,48)**

අනෙක් පැත්තෙන් දේව විශ්වාසවන්තයින්ගේ උතුම් ගුණාංග ගැන ද අල්ලාහ් මෙසේ පවසයි:

﴿ إِنَّمَا كَانَ قَوْلَ ٱلْمُؤْمِنِينَ إِذَا دُعُوٓاْ إِلَى ٱللَّهِ وَرَسُولِهِۦ لِيَحْكُمَ بَيْنَهُمْ أَن يَقُولُواْ سَمِعْنَا وَأَطَعْنَا﴾ [النور، الآية ٥١]

***"දේව විශ්වාසය ඇති අය අතර ඇති ආරවුල් වලදී විසඳුම් උබාදීම පිණිස අල්ලාහ් වෙත ද, ඔහුගේ වක්තෘවරයා වෙත ද, කැඳවනු ලැබූ කල්හි, "අපි සවන්දුන්නෙමු; කීකරු වෙමු!" යනුවෙන් පවසති. මෙවන් අය ජය ලබන්නෝ වෙති. කවර අය අල්ලාහ්ට සහ ඔහුගේ වක්තෘවරයාට කීකරු වී, අල්ලාහ්ට බිය වී ඔහුට විරුද්ධව හැසිරීමෙන් වළකින්නෝ ද, ඔවුහු ජය ලබන්නෝ වෙති."***

**(අල් කුර්ආන් 24 : 51,52)**

**ෂයිබා ගේ දියණිය වූ ෂපියියාහ් මෙසේ කීවා ය:**

عن صفية بنت شيبة قالت: بينما نحن عند عائشة رضي الله عنها قالت: فذكرت نساء قريش وفضلهن، فقالت عائشة رضي الله عنها: " إنّ لنساء قريش لفضلاً ، وإني والله ما رأيتُ أفضل من نساء الأنصار أشدَّ تصديقاً لكتاب الله، ولا إيماناً بالتنزيل، لقد أُنزِلَت سورة النور: ﴿وليضربن بخُمرهِنَّ﴾، فانقلب رجالُهُنَّ إليهنَّ يتلون عليهنَّ ما أنزل الله إليهم فيها، ويتلو الرجل على امرأته، وابنته، وأخته، وعلى كل ذي قرابته، فما منهُنّ امرأة إلاّ قامت إلى مِرْطِهَا المرحَّلِ فاعتَجَرَت به – تصديقاً وإيماناً بما أنزل الله من كتابه، فأصبحْنَ وراء رسول الله – صلى الله عليه وسلم – معتجرات كأنَّ على رؤوسِهِنَّ الغربان.

***"අපි ආයිෂා (රළි) තුමිය සමඟ සිටිය (එක්) අවස්ථාවක දී කුරෙෂ් (කුලයේ) කාන්තාවන් ගැන හා ඔවුන්ගේ උසස් ගතිගුණ ගැන ද කීවෙමු. එවිට, ආයිෂා (රළි) තුමිය, 'ඇත්තෙන් ම කුරෙෂ් (කුලයේ) කාන්තාවන් වෙත උතුම් ගතිගුණ ඇත්තේ ය. එමෙන් ම, අල්ලාහ්ගේ නාමයෙන්, අල්ලාහ්ගේ ග්‍රන්ථය (කුර්ආනය) පිළිගැනීමේ දීත්, (ඔහු) අනාවරණය කළ දේ කෙරෙහි විශ්වාසය තැබීමේ දීත් අන්සාරී කාන්තාවන්ට වඩා ශ්‍රේෂ්ඨවන් අය මම නොදුක්කෙමි යි" කීවා ය. (මෙතකින් නොනැවතුනු එතුමිය) 'සූරතුන් නූර්' (නම් වූ පරිච්ඡේදය) අනාවරණය කළ විට,***

﴿ وَلْيَضْرِبْنَ بِخُمُرِهِنَّ عَلَىٰ جُيُوبِهِنَّ ﴾

***"තමන්ගේ පයෝද්ර උතුරු සළුවකින් ආවරණය කළ යුතුයි!"*** [53]
නම් වූ වාක්‍යයන් එහි අඩංගු බව දැනගත් ඔවුන්ගේ ස්වාමි පුරුෂයින්, වහාම ඔවුන් වෙත හැරී එය පාරායනා කළෝ ය. මෙලෙස – තම භාර්යාවන්ටත්, දියණියන්ටත්, සහෝදරියන්ටත්, සෑම කාන්තාවකටත් එම වාක්‍ය පාරායනා කර පෙන්වූ හ. මෙයට සවන් දුන් කාන්තාවන්ගෙන් එක් කාන්තාවක්වත් නොහැර (සැමදෙනාම) තමන්ගේ 'මිර්ත්' (වැස්ම) ගෙන හිස, මුහුණ යනාදිය වසා ගත් හ. අල්ලාහ් තම වාක්‍යයන් අනාවරණය කළවිට, ඒවා සම්පූර්ණයෙන් පිළිගෙන, විශ්වාස කර මෙලෙස ඔවුන් (අන්සාරී කාන්තාවන්) හැසුරුණේය. පසුදින උදෑසන නබි (සල්) තුමාගේ පිටුපසින්, තම තමන්ගේ හිසෙහි කළු කපුටෝ සිටිනවා මෙන් වසාගෙන ඔවුහු පැමිණිය හ." [54]

එහෙයින්, අල්ලාහ්ගේ අණ පිළිපැදීම හැර විමුක්තියට වෙත මාර්ගයක් නැත. ඔහුගේ අණ පිළිපැදීමෙ හි අබමල් රේණුවක තරම්වත් පසුබට නොවිය යුතුයි.

---

53. අල් කුර්ආන් 24:31.
54. 'තෆ්සීර් ඉබ්නු කසීර්' හි වාක්‍ය 5:90 සඳහා වූ විවරණය.

"මාගේ මුස්ලිම් සහෝදරියනි! තම තමන්ගේ වැරදි තේරුම් ගෙන, පශ්චාත්තාප්පයට පත්වී, සමාව අයැ ද, පිවිතුරු (වැරදිවලින් නිදහස්) වීමට එන්න. "මම මගේ පව් ගැන පශ්චාත්තාප්පයෙන් යුතුව අල්ලාහ්ගෙන් සමාව අයැද සිටිමි; හිජාබ ය නියමාකාරයට ම පිළිපැද මාගේ ශරීරය වසා ගනිමි"යි කියන්න. අපගේ පාපයන් කෙරෙහි සමාව අයැද සිටීම අතපසු කිරීම ද පාපයක් ය.

මූසා (අලෙයි) තුමාගේ මුවින් පිට වූ වචනයන් ඔබගේ මුවින් ද පිටවිය යුතුයි.

එම වචන මෙසේ ය:

﴿وَعَجِلْتُ إِلَيْكَ رَبِّ لِتَرْضَىٰ﴾ [طه، الآية ٨٤]

***"මාගේ අධිපතියාණෙනි! මම ඉක්මන් වී ඔබ වෙත පැමිණ ඇත්තේ, ඔබ මා කෙරෙහි තෘප්තිමත් වීම පිණිස වේ. !"***

**(අල් කුර්ආන් 20 : 84)**

එමෙන් ම, විශ්වාස වන්තයන් වූ ස්ත්‍රී පුරුෂයන්ගේ පොරොන්දුව මෙන් ඔබගේ පොරොන්දුව ද විය යුතුයි.

එම පොරොන්දුව මෙසේ ය:

﴿سَمِعْنَا وَأَطَعْنَا غُفْرَانَكَ رَبَّنَا وَإِلَيْكَ الْمَصِيرُ﴾ [البقرة، الآية ٢٨٥]

"(අපගේ අධිපතියාණෙනි!) අපි මාර්ගෝපදේශය ඇසීමු. ඊට අවනත ද වීමු. අප ස්වාමීනි, අපට සමාව දෙනැයි අපි ඔබගෙන් අපේක්ෂා කරමු. සියලු දෙනාම යළි පැමිණිය යුත්තේ ඔබ වෙතටයි."

**(අල් කුර්ආන් 2 : 285)**

- මෙම පොතේ අනේක තැන් හි ඊමාන්, ඊමාන්ධාරීන්, මුඃමින්වරු යන වචන ඇත. 'ඊමාන්' යන්නෙ හි තේරුම 'විශ්වාසය' නම් වේ. ඊමාන්ධාරීන් හෝ මුඃමින්වරු හෝ කියන්නේ 'විශ්වාසවන්තයන්' යන අදහසිනි.

  ඉස්ලාමීය ඉගැන්වීම් අනුව පහත සඳහන් ප්‍රධාන කරුණු හයම විශ්වාස කිරීම 'ඊමාන්' යනු කියනු ලැබේ; එම විශ්වාසය ඇත්තා වෙයි.

| | අරාබි භාෂාවෙන් කියවෙන මෙය සිංහලට නගා මෙසේ කියන්න. | | මේවායේ තේරුම |
|---|---|---|---|
| 1. | ආමන්තුබිල්ලාහි | – | අල්ලාහ්ගේ ඒකීයභාවය |
| 2. | ව මලාඉක්කතිහී | – | (ඔහුගේ) මලාඉකාවරු |
| 3. | ව කුතුබි හී | – | (ඔහුගේ) පුස්තක |
| 4. | ව රුසුලිහී | – | (ඔහුගේ) නබී (වක්තෘ) වරු |
| 5. | වල් යව්මිල් ආ හිර් | – | විනිශ්චය දිනය |
| 6. | වල්කද්රි හයිරිහී වසර්රිහි මිනල්ලාහි තආලා | – | හොඳ නොහොඳ සියල්ලම අල්ලාහ්ගේ පෙරම්නුම අනුව ක්‍රියාවෙයි. |

---

- මෙම පොතේ වරහන් තුළ යොද ඇති කෙටි අක්ෂර මුළුමනින් උච්චාරණය කළයුතු ආකාරය හා ඒවායේ තේරුම පහත සඳහන් වෙයි.

1. (සල්) සල්ලල්ලාහු අලෛහි ව සල්ලම්
   (අල්ලාහ්ගේ ශාන්තිය හා ආශිර්වාද එතුමාට ලැබේවා!)

2. (අලෛ) අලෛහිස්සලාම්
   (අල්ලාහ්ගේ ශාන්තිය එතුමාට ලැබේවා!)

3. (රළි) රළියල්ලාහු අන්හු (පිරිමින්)

4. (රළි) රළියල්ලාහු අන්හා (ස්ත්‍රීන්)
   (අල්ලාහ්ගේ කරුණාව එතුමාට / එතුමියට ලැබේවා!)

5. (රහ්) රහ්මතුල්ලාහි අලෛහි'
   (අල්ලාහ්ගේ කරුණාව එතුමාට ලැබේවා!)

ⓒ المكتب التعاوني للدعوة والإرشاد بالبديعة : ١٤١٥هـ

فهرست مكتبة الملك فهد الوطنية

إسماعيل محمد

الحجاب . . لماذا ؟ . ترجمة شريف الدين محمد منصور

٥٦ صفحة ، ١٤ × ٢١ سم .

ردمك ٠ ـ ١٩ ـ ٧٩٩ ـ ٩٩٦٠ .

النص باللغة السنهالية .

١ ـ الوعظ والإرشاد . ٢ ـ المرأة في الإسلام . ٣ ـ الحجاب والسفور .

( أ ) منصور ، شريف الدين محمد ( مترجم ) .

(ب) العنوان .

ديوي ٢١٩,١ ١٥/١٣٣٣

رقم الإيداع : ١٥/١٣٣٣

ردمك : ٠ ـ ١٩ ـ ٧٩٩ ـ ٩٩٦٠

# الحجاب لماذا ؟

تأليف فضيلة الشيخ
د. محمد بن إسماعيل

ترجمه للسنهالية
شريف الدين منصور

# الحجاب لماذا ؟

تأليف فضيلة الشيخ

**د. محمد بن إسماعيل**

ترجمة

**شريف الدين محمد منصور**

**سنهالي - ٢٥٣**

ردمك: ٠-١٩-٧٩٩-٩٩٦٠

The Co-operative office for Call & foreigners Guidance at Sultanah

المكتب التعاوني للدعوة والإرشاد وتوعية الجاليات بسلطانة

تحت إشراف وزارة الشؤون الإسلامية والأوقاف والدعوة والإرشاد

هاتف: ٤٢٤٠٠٢٢ ناسوخ: ٤٢٥١٠٠٥ ص ب ٩٢٦٧٥ الرياض ١١٦٦٣ بريد الكتروني Email : Sultanah22@hotmail.com